# ආපදා අවදානම් අවම කිරීම පිළිබඳ ගෝලීය තක්සේරු වාර්තාව

## 2015

**සංක්ෂිප්ත ගෝලීය තක්සේරු වාර්තාව 2015**

සංවර්ධනය තිරසර කිරීම:
ආපදා අවදානම් කළමනාකරණයේ අනාගතය

United Nations

ආපදා අවදානම් අවම කිරීම සඳහා වූ එක්සත් ජාතීන්ගේ කාර්යාලය (UNISDR) ආපදා අවදානම් අවම කිරීම පිළිබඳ 2015 ගෝලීය තක්සේරු වාර්තාව සම්පාදනය කිරීම සඳහා ලබා දුන් දායකත්වය වෙනුවෙන් පහත ලාංඡන විදහා දැක්වෙන සංවිධාන වෙත සිය කෘතඥතාව පළ කර සිටී. මීට අමතරව යුරෝපා සංගමය (මානුෂීය ආධාර හා සිවිල් රැකවරණය සඳහා වූ කාර්යාංශයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ සංවර්ධනය හා සහයෝගිතාව පිළිබඳ කාර්යාංශයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා), එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ සටහන (UNDP) හා ඇමරිකා එක්සත් ජනපද ආණ්ඩුව ද මේ උදෙසා නිර්ලෝභීව සිය මූල්‍ය සම්පත් දායක කළේ ය.

GAR

# ආපදා අවදානම් අවම කිරීම පිළිබඳ ගෝලීය තක්සේරු වාර්තාව

2015

**සංක්ෂිප්ත ගෝලීය තක්සේරු වාර්තාව 2015**

සංවර්ධනය තිරසර කිරීම:

ආපදා අවදානම් කළමනාකරණයේ අනාගතය

United Nations

ආපදා අවදානම් අවම කිරීම පිළිබඳ ගෝලීය තක්සේරු වාර්තාව (Golbal Assessment Report – GAR) 2015 තුළ අඩංගු වන්නේ වැඩි දියුණු කරන ලද අන්තර්ගතයකි. යථාර්ථය පිළිබඳ අමතර තොරතුරු දක්වන අයිකන (augmented reality – AR – icons) වාර්තාව සහ එහි සහායක මෘදුකාංග යෙදුම (GAR for Tangible Earth – GfT) එකිනෙකට සම්බන්ධ කර පාඨකයා වෙත අමතර තොරතුරු ද මල්ටිමීඩියා අන්තර්ගතයන් ද සම්පාදනය කරයි.

මෙම අංග භාවිත කිරීමට නම් පළමුව කළ යුත්තේ ඔබගේ GfT ඉන්ස්ටෝල් කරන ලද ටැබ්ලට් පරිගණකයේ හෝ ස්මාට් දුරකථනයේ අදාළ අයිකනය මතට කැමරාව ගෙන ගොස් AR බොත්තම දිස් වූ විට එය එබීම යි. එවිට පාඨක අත්දැකීම පෝෂණය කිරීම සඳහා සැලසුම් කළ නානාවිධ සක්‍රිය තොරතුරු කාර්ය මාලාවක් ඔබගේ උපකරණය මත දිග හැරීමට පටන් ගනී.







**The Earth Icon:** (පෘථිවි අයිකනය): පරිහරණය කරන්නා සක්‍රිය ත්‍රිමාන පෘථිවි ගෝලයකට සම්බන්ධ කර පෙළෙහි අන්තර්ගත විෂයට අදාළ භූගෝලීය දත්ත විමසා බැලීමට හැකියාව ලබා දෙයි.

**The Video Icon:** (වීඩියෝ අයිකනය): පෙළෙහි අන්තර්ගත විෂයට අදාළ වන UNISDR ආයතනයේ හා හවුල්කරුවන්ගේ වීඩියෝවලට පරිහරණය කරන්නා සම්බන්ධ කරයි.

සම්පූර්ණ වාර්තාව ඩවුන්ලෝඩ් කරන්න:

මෘදුකාංග යෙදුම ඩවුන්ලෝඩ් කිරීම සඳහා මෙම ලියවිල්ල අවසානයේ සපයා තිබෙන QR කේතය යොදා ගන්න. එසේ නැත් නම් www.preventionweb.net/gar වෙබ් පිටුවට පිවිසෙන්න.

ගෝලීය තක්සේරු වාර්තාව පිළිබඳ ඔබගේ අදහස් දැක්වීම් හා ප්‍රවෘත්ති ට්විටර් හා ෆේස්බුක් අඩවිවල දී බෙදාහදා ගැනීමට අවශ්‍ය නම් කරුණාකර #GAR15 යොදා ගන්න.

© එක්සත් ජාතීන්ගේ සංවිධානය 2015. සියලු ම හිමිකම් ඇවිරිණි.

වගකීම් අත් හැරීම
මෙම ප්‍රකාශනය තුළ පළ කර තිබෙන අදහස්වලින් එක්සත් ජාතීන්ගේ ලේකම් කාර්යාලයේ අදහස් පිළිබිඹු නො වේ. යොදා ගෙන තිබෙන නිල නාමයන් මගින් හෝ තොරතුරු ද්‍රව්‍ය ඉදිරිපත් කෙරෙන ආකාරය මගින් යම් රටක, භූමි ප්‍රදේශයක, නගරයක හෝ මණ්ඩියක හෝ එවායේ බලධාරී ආයතනවල නීතිමය තත්ත්වය සම්බන්ධයෙන් හෝ එවායේ මායිම් හෝ දේශ සීමා නිරූපණය කර තිබෙන ආකාරය සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ ලේකම් කාර්යාලය කවර හෝ මතයක් පළ කරන බවක් අදහස් නො වේ.

මෙම ප්‍රකාශනය උපුටා දැක්වීමට නිදහස තිබෙන නමුත් මූලාශ්‍රය දක්වන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.
මූලාශ්‍රය දැක්විය යුතු ආකාරය: UNISDR (2015). The Pocket GAR 2015. Making Development Sustainable: The Future of Disaster Risk Management. Geneva, Switzerland: United Nations Office for Disaster Risk Reduction (UNISDR).

සැකැස්ම සහ පිටු සැලසුම: AXIS and ELP, ටෝකියෝ, ජපානය. Takae Ooka, නිව්යෝක්, ඇමරිකා එක්සත් ජනපදය.
සංස්කරණය: ක්‍රිස්ටෝෆර් ජේ. ඇන්ඩර්සන්, වියානා, ඕස්ට්‍රියාව.
මුද්‍රණය: Imprimerie Gonnet, බෙලී, ප්‍රංශය.

# සාරාංශය

## සංවර්ධනයේ අනාගතය අවදානමක

2015 යනු සංවර්ධනයේ අනාගතය සඳහා තීරණාත්මක වසරකි. මෙම වර්ෂය එළඹෙන වසරවල දී ආපදා අවදානම් අවම කිරීම, තිරසර සංවර්ධනය හා දේශගුණික විපර්යාසය සම්බන්ධ ක්‍රියාවන්ට ප්‍රවිෂ්ට වන හා අවධානය යොමු කරන න්‍යාය පත්‍රය සකස් කරන ජාත්‍යන්තර ක්‍රියාවලි තුනක සමාප්තිය සලකුණු කරයි.

2015 මාර්තුවේ ජපානයේ සෙන්ඩායිහි පැවැත්වෙන ආපදා අවදානම් අවම කිරීම පිළිබඳ ලෝක සමුළුවේ දී එක්සත් ජාතීන්ගේ සාමාජික රාජ්‍යයන් හියෝගෝ ක්‍රියා රාමුව (Hyogo Framework for Action – HFA) සාර්ථක කර ගැනීම සඳහා වූ රාමුවක් සම්මත කර ගනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙම නව රාමුව අනාගතයේ දී ආපදා හානි අවම කිරීම සැලකිය යුතු මට්ටමකින් සාක්ෂාත් කර ගැනීම සඳහා දරන පරිශ්‍රමයන්හි දී රටවල්වලට මග පෙන්වනු ඇත.

2015 සැප්තැම්බර් වන විට 2012 රියෝ-20 (Rio+20) සමුළුවේ ද සහස්‍රක සංවර්ධන පරමාර්ථවල (Millennium Development Goals – MDGs) ද ප්‍රතිඵලය පදනම් කර ගත් තිරසර සංවර්ධන පරමාර්ථ (Sustainable Development Goals – SDGs) මාලාවකට ආණ්ඩු එකඟ වී සිටිනු ඇත. පළමු වතාවට මෙම නව පරමාර්ථ ගෝලීය මට්ටමින් යොදා ගැනීම සඳහා සැලසුම් සකස් කෙරෙනු ඇත.

අවසානයේ දී දේශගුණික විපර්යාසය සම්බන්ධයෙන් ගෝලීය එකඟතාවක් ඇති කර ගැනීමේ අරමුණෙන් යුතුව දේශගුණික විපර්යාසය පිළිබඳ එක්සත් ජාතීන්ගේ රාමු සම්මුතියේ (United Nations Framework Convention on Climate Change – UNFCCC) පාර්ශ්වකරුවන්ගේ 21 වන සමුළුව සහ කියෝතෝ කෙටුම්පත් ගිවිසුමේ පාර්ශ්වකරුවන්ගේ රැස්වීමේ 11 වන සැසි වාරය 2015 දෙසැම්බරයෙහි පැරීසියේ දී පැවැත්වෙනු ඇත.

ගෝලීය ක්‍රියාවලි තුන ම සාර්ථක කර ගැනීම සඳහා සහ ක්‍රියාවේ දී ඒවා අතර ඒකාබද්ධතාව මුදුන් පමුණුවා ගැනීම සඳහා නම් ආපදා අවදානම් අවම කිරීම උදෙසා වූ වඩා ශක්තිමත් කැප වීමක් හා ආයෝජනයක් අත්‍යවශ්‍ය බව පෙන්නුම් කරන ප්‍රබල සාක්ෂි ආපදා අවදානම් අවම කිරීම පිළිබඳ 2015 ගෝලීය තක්සේරු වාර්තාව (GAR15) විසින් රැස් කරනු ලැබ ඇත.

## ආපදා අවදානම් අවම නොකළ හොත් තිරසර සංවර්ධනය මුදුන් පමුණුවා ගත නොහැකි ය

වර්තමාන පරිසර තත්ත්වය තුළ දී භූමිකම්පා, සුනාමි, නිවර්තන සුළි කුණාටු හා ගංවතුර ගැලීම් නිසා ගෝලීය පරිමාණව සිදු වෙති යි අපේක්ෂා කෙරෙන සාමාන්‍ය වාර්ෂික හානිය (average annual loss – AAL) එ.ජ. ඩොලර් බිලියන 314ක් වෙතැයි දැන් තක්සේරු කරනු ලැබ ඇත. නියඟය වැනි වෙනත් ආපදාවන් ද කෘෂිකර්මය වැනි අනෙකුත් අංශ ද ඇතුළත් කළ හොත් මෙම සංඛ්‍යාව මීටත් වඩා ඉහළ යනු ඇත. සාමාන්‍ය වාර්ෂික හානියෙන් නියෝජනය වන්නේ අනාගතයේ දී වසරක් පාසා දිගු කාලීනව ඇති වන හානිවල වටිනාකම වන අතර රටවල් අනාගත ආපදා හානි ආවරණය කිරීම සඳහා වාර්ෂිකව වෙන් කළ යුතු මුදල් ප්‍රමාණය ලෙස එය අර්ථ නිරූපණය කළ හැකි ය.

අවදානම අවම නොකළ හොත් අපේක්ෂිත අනාගත හානි සංවර්ධනය සම්බන්ධ තීරණාත්මක ආවස්ථික (අවස්ථානුකූල) පිරිවැයක් බවට පත් වනු ඇත. විශේෂයෙන් ම ආපදා අවදානම මේ වන විට ප්‍රාග්ධන ආයෝජනයේ හා සමාජ වියදමේ සැලකිය යුතු කොටසක් බවට පත්ව තිබෙන රටවල දී අනාගත සංවර්ධන හැකියාව බරපතළ ලෙස දුබල වනු ඇත. එවැනි තත්ත්වයන්හි දී තිරසර සංවර්ධනයක් තබා ස්ථාවර සංවර්ධනයක් වත් මුදුන් පමුණුවා ගැනීම අසීරු ය.

බොහෝ රටවල දී දේශගුණික විපර්යාසය අවදානම් විශාල කරන අතර ආපදා පිරිවැය වැඩි කරයි. උදාහරණයක් ලෙස කැරිබියානු රටවල දී 2050 වන විට නිවර්තන සුළි කුණාටු ආශ්‍රිතව පමණක් සාමාන්‍ය වාර්ෂික හානිය එ.ජ. ඩොලර් බිලියන 1.4ක් තරම් ප්‍රමාණයකින් වැඩි වෙති යි අපේක්ෂා කෙරේ. සංවර්ධනය වෙමින් පවතින කුඩා දිවයින් රාජ්‍යයන් (small island developing states – SIDS) අතරින් බොහොමයක් දැනට මත් විවිධ මට්ටම්වලින් ඉහළ ආපදා අවදානම්වලට මුහුණ දෙයි. එම නිසා දේශගුණික විපර්යාසයේ බලපෑමෙන් එම රටවල් ආරක්ෂා කිරීමට නම් එම අවදානම් අවම කිරීම අත්‍යවශ්‍ය වේ.

## ආපදා අවදානම් අවම කිරීම යහපත් ආයෝජනයකි

මේ නිසා ආපදා අවදානම් අවම කිරීමෙහි ලා ආයෝජනය කිරීම වෙනස් වෙමින් පවතින දේශගුණයක් තුළ තිරසර ලෙස සංවර්ධනය වීම සඳහා සැපිරිය යුතු පූර්ව කොන්දේසියක් බවට පත් වේ. එය සාක්ෂාත් කර ගත හැකි පූර්ව කොන්දේසියක් වන අතර වාසිදායක මූල්‍යමය අර්ථයක් ගැබ් කර ගත්තකි. නාගරික යටිතල පහසුකම් වැනි නව ආයෝජන අවශ්‍යතා නිසා ගෝලීය සාමාන්‍ය වාර්ෂික හානිය ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර 2030 වෙද්දී එ.ජ. ඩොලර් ට්‍රිලියන 90ක් වෙතැයි මේ වන විට තක්සේරු කර ඇත.[1] ඒ කෙසේ වුව ද මෙය නො වැළැක්විය හැකි තත්ත්වයක් නො වේ. නිසි ආපදා අවදානම් කළමනාකරණ ක්‍රමෝපායන් උදෙසා කෙරෙන වාර්ෂික ගෝලීය ආයෝජනය එ.ජ. ඩොලර් බිලියන 6ක් වුව හොත් අවදානම් අවම කිරීම නිසා එ.ජ. ඩොලර් බිලියන 360ක ප්‍රතිලාභයක් අත් වනු ඇත.[2] මෙය නව හා අමතර සාමාන්‍ය වාර්ෂික හානි වාර්ෂිකව සියයට 20කට වැඩියෙන් අවම කිරීමකට සමාන ය.

ආපදා අවදානම් අවම කිරීමෙහි ලා එවැනි ආයෝජනයක් කිරීම යනු මීළඟ වසර 15 දී යටිතල පහසුකම් සඳහා වාර්ෂිකව ආයෝජනය කිරීමට සිදු වන්නේ එ.ජ. ඩොලර් ට්‍රිලියන 6න් සියයට 0.1ක් පමණක් බව යි. එහෙත් බොහෝ රටවල දී එම සුළු අමතර ආයෝජනයට දරිද්‍රතාව අවසන් කිරීමේ, සෞඛ්‍යය හා අධ්‍යාපනය වැඩි දියුණු කිරීමේ, තිරසර හා සාධාරණ සංවර්ධනය සහතික කිරීමේ ජාතික හා ජාත්‍යන්තර පරමාර්ථ සාක්ෂාත් කර ගැනීමෙහි ලා තීරණාත්මක වෙනසක් කළ හැකි ය.

## කළමනාකරණය කරන ලද ආපදා, කළමනාකරණය නොකරන ලද අවදානම්

එක්සත් ජාතීන්ගේ සාමාජික රාජ්‍යයන් ස්වාභාවික ආපදා අවම කිරීමේ ජාත්‍යන්තර දශකය (International Decade for Natural Disaster Reduction – IDNDR) සම්මත කර විසිපස් වසරක් ද හියෝගෝ ක්‍රියා රාමුව සම්මත කර දස වසරක් ද ගත වී තිබෙන නමුත් ගෝලීය ආපදා අවදානම සැලකිය යුතු මට්ටමකින් අඩු වී නැත. සමහර රටවල දී හා නගරවල දී සමහර ආපදාවන්ට අදාළව මරණ සංඛ්‍යාව හා ආර්ථික හානි අවම කිරීමෙහි ලා සාර්ථකත්වයක් අත් කර ගෙන තිබෙන නමුත් සමස්ත ආපදා අවදානම තව මත් වැඩි වෙමින් පවතී.

අහිමි වන මානව ජීව වර්ෂ සංඛ්‍යාව අනුව මැන බැලූ විට ආපදා නිසා ක්ෂය රෝගය වැනි රෝග නිසා ඇති වන පසුබෑමට සමාන පසුබෑමක් සංවර්ධනයෙහි ලා ඇති වන බව පැහැදිලි වේ. සෑම වසරක ම ජාත්‍යන්තරව වාර්තා වන ආපදාවල දී මානව ජීව වර්ෂ මිලියන 42කට ආසන්න ප්‍රමාණයක් අහිමි වේ. මෙම හානි සංසන්දනාත්මකව වැඩි වශයෙන් ඇති වන්නේ පහළ හා මැදි ආදායම් කාණ්ඩයන්ට අයත් රටවල් තුළ ය.

විශේෂ තැති ගැනීමක් ඇති කරන වර්ධනයක් වන්නේ යළි යළිත් ඇති වන චඩා කුඩා පරිමාණයේ ප්‍රාදේශීය ආපදා ආශ්‍රිත මරණ හා ආර්ථික හානි වැඩි වෙමින් පැවතීම යි. අසමානාත්මතාව, පාරිසරික හායනය, අයහපත් ආකාරයෙන් සැලසුම් කොට කළමනාකරණය කෙරෙන නාගරික සංවර්ධනය හා දුර්වල පාලනය වැනි සාධක සමග මෙම විශාල අවදානම් සම්පව සම්බන්ධ ය. එම අවදානම් ප්‍රධාන වශයෙන් බලපාන්නේ රාජ්‍ය යටිතල පහසුකම් මත රඳා පවතින පහළ ආදායම් කුටුම්බවලට හා සුළු ව්‍යාපාරවලට සහ එම යටිතල පහසුකම් සම්පාදනය කරන පළාත් පාලන ආයතනවලට ය.

හියෝගෝ ක්‍රියා රාමුව ආපදා අවදානම් අවම කිරීමට සම්බන්ධිතව ජාතික ආණ්ඩු, මහ නගර සභා, උපයෝගිතා සේවා සම්පාදකයන්, රාජ්‍ය නොවන සංවිධාන, විද්‍යාත්මක හා තාක්ෂණික ආයතන, කලාපීය හා ජාත්‍යන්තර සංවිධාන සහ පෞද්ගලික අංශය ඇතුළු සියලු මට්ටම්වල පාර්ශ්වකරුවන් වෙතින් සැලකිය යුතු ආයෝජනයක් ජනනය කර ගෙන ඇත.

කෙසේ වුව ද හියෝගෝ ක්‍රියා රාමුව ඇති විය හැකි අවදානම් හා ඒවාට තුඩු දෙන සාධක කළමනාකරණය කිරීමට අදාළ සවිස්තරාත්මක මාර්ගෝපදේශ සපයා තිබෙන නමුත් බොහෝ රටවල් ආපදා අවදානම් අවම කිරීම ආපදා කළමනාකරණය ලෙස අවබෝධ කර ගෙන ප්‍රධාන වශයෙන් කරන්නේ ආපදා පෙර සූදානම, ප්‍රතිචාරය හා කල් තබා අනතුරු ඇඟවීම සම්බන්ධ සිය හැකියාවන් ශක්තිමත් කිරීම හා සුවිශේෂ අවදානම් පමණක් අවම කිරීම යි.

මෙම ප්‍රවිෂ්ටය ආපදා කළමනාකරණය සඳහා සුදුසු ක්‍රමයක් වෙතත් ඇති විය හැකි අවදානම් කළමනාකරණයේ දී ඉතා අසාර්ථක බව ඔප්පු වී ඇත. මෙම අවදානම් ජනනය වන්නේ සංවර්ධනය *තුළ දී* බැවින් ඒවාට විසඳුම් සෙවීමට නම් දරිද්‍රතාව අවම කිරීම, නගර නිසි පරිදි සැලසුම් කිරීම හා කළමනාකරණය කිරීම සහ පරිසර පද්ධති ආරක්ෂා කිරීම හා යථා තත්ත්වයට කිරීම වැනි ක්‍රියා මාර්ග අවශ්‍ය වේ.

හියෝගෝ ක්‍රියා රාමුව ක්‍රියාත්මක වන අතරවාරයේ බොහෝ රටවල දී ප්‍රගතිය සීමා වී තිබෙන ක්ෂේත්‍රය මෙය යි. සමාජීය හා ආර්ථික ආයෝජනවල දී ආපදා අවදානම් සාධක පූර්ණ ලෙස සැලකිල්ලට ගන්නා හෝ අවදානම් දැනුම සංවර්ධන සැලසුම්වලට හා පරිචයන්ට ඒකාබද්ධ කරන අවස්ථා තව මත් දක්නට නැත. ඒ නිසා ම ආපදා කළමනාකරණය සම්බන්ධ සැලකිය යුතු වැඩි දියුණු වීම් තිබිය දී ම පවත්නා අවදානම් අවම කිරීමට වඩා වැඩි වේගයකින් නව අවදානම් ජනනය වීම හා ඒකරාශි වීම සිදු වී ඇත.

## ආපදා අවදානම් අවම කිරීමේ අනාගතය

ආපදා අවදානම දැනට මත් බොහෝ රටවල දී තිරසර ලෙස සංවර්ධනය වීම සඳහා අවශ්‍ය ප්‍රාග්ධන ආයෝජන හා සමාජ වියදම් කිරීමේ හැකියාව දුබල කරමින් පවතී. ඒ සමග ම ගෝලීය අසමානතාව වැඩීම, ආපදාවලට නිරාවරණය වීම ඉහළ යාම, නාගරීකරණය වේගවත් වීම සහ බලශක්තිය හා ස්වාභාවික ප්‍රාග්ධනය පමණ ඉක්මවා පරිභෝජනය කිරීම නිසා පද්ධතිමය ගෝලීය බලපෑම් ඇති වන අන්තරායකර හා අනපේක්ෂිත මට්ටම්වලට අවදානම් පත් වීමේ තර්ජනය මතු වේ. විශේෂයෙන් ම ග්‍රහ ලෝකයේ ජෛව හැකියාව හීන වෙමින් පවතින බැවින් ආපදා අවදානම අවම කිරීම සඳහා අවශ්‍ය පරිශ්‍රමයන්හි හා සම්පත්වල මට්ටම අනාගත පරම්පරාවන්ගේ හැකියාව ඉක්මවා ගිය මට්ටමක් කරා ළඟා වී අසමතුලිත තත්ත්වයක් ඇති වීමට දැන් සැබවින් ම ඉඩකඩක් පවතී. මෙය අනාගත ආපදා අවදානම් අවම කිරීම හමුවේ තීරණාත්මක අභියෝගයක් මතු කරයි.

ආපදා අවදානම වේගයෙන් වර්ධනය වීම වැළැක්විය හැක්කේ මෙම අවදානම් සාධක කෙරෙහි අවධානය යොමු කිරීමෙන් පමණක් බවට පොදු මතයක් ගොඩ නැගෙමින් ඇත. යම් මට්ටමකින් ඔබ්බට ගිය විට සමාජ ප්‍රගතිය හා මානව සංවර්ධනය අසීමිත ආර්ථික වර්ධනය හා ඉහළ යන බලශක්ති පරිභෝජනය මත රඳා නොපවතින්නේ ය යන අදහස වඩ වඩා පිළිගැනීමට ලක් වෙමින් තිබෙන අතර දැන් තිරසර සංවර්ධනය පිළිබඳ ගෝලීය සාකච්ඡාව පෝෂණය කරමින් පවතී.

යළි අලුත් කළ හැකි බලශක්තිය, ජල හා අපද්‍රව්‍ය කළමනාකරණය, ස්වාභාවික සම්පත් කළමනාකරණය, හරිත ගොඩනැගිලි හා යටිතල පහසුකම් සහ තිරසර කෘෂිකර්මය ආශ්‍රිත සංවර්ධන පරිචයන් පරිවර්තනය කිරීම සඳහා පෞද්ගලික අංශය, පුරවැසියන් හා නගර වැඩි වන ජවයකින් යුතුව කටයුතු කරමින් සිටී. සංවර්ධනය ආශ්‍රිතව සිදු වන මෙම පරිවර්තන ආපදා අවදානම් අවම කිරීම සඳහා ද දායක වේ: උදාහරණයක් ලෙස කාබන් අඩු ආර්ථිකයකට පරිවර්තනය වීම ව්‍යසනකාරී දේශගුණික විපර්යාස ඇති වීමේ අවදානම අවම කරයි; නියාමනය කෙරෙන පරිසර පද්ධති ආරක්ෂා කිරීම හා ප්‍රකෘතිමත් කිරීම මගින් නොයෙක් ආපදා අවම විය හැකි ය; එසේ ම ආපදා සංවේදී කෘෂිකර්මය නිසා ආහාර සුරක්ෂිතතාව ශක්තිමත් විය හැකි ය.

එහෙත් සංවර්ධනයෙහි ලා සිදු වන මෙම පරිවර්තනයන්ට සහාය වීමට නම් ආපදා අවදානම් අවම කිරීම සඳහා දැන් ප්‍රවිෂ්ට වන ආකාරය යළි අර්ථ නිරූපණය කිරීම ද අත්‍යවශ්‍ය වේ. *බාහිර* තර්ජනයන්ගෙන් ආරක්ෂා වීම පිණිස ආපදා අවදානම් අවම කිරීම ප්‍රධාන ප්‍රවාහගත කිරීම වෙනුවට සමාජීය හා ආර්ථික ක්‍රියාකාරකම් තුළ *නිසගයෙන්* ම ගැබ් වන අවදානම් කළමනාකරණය කිරීම ආපදා අවදානම් අවම කිරීම ආශ්‍රිත වත්මන් ප්‍රවිෂ්ටයට බෙහෙවින් වෙනස් වන්නකි. කළමනාකරණය නොකළ අවදානම් තව මත් පවතින බව පෙන්නුම් කරන දර්ශකයක් ලෙස ආපදා කළමනාකරණය සැලකීම වෙනුවට අවදානම් කළමනාකරණය දැන් සංවර්ධනයේ අමතර අංගයක් නො ව එහි ඩීඑන්ඒ තුළ ම කා වැදී ගත් පරිචයන් මාලාවක් වී සංවර්ධන කලාවේ නිසග ලක්ෂණයක් බවට පත් විය යුතු බව ඉන් හැගේ.

එම නිසා 2015 ගෝලීය තක්සේරු වාර්තාවේ ප්‍රධාන පණිවුඩය වන්නේ පරිවර්තනයට පහසුකම් සපයා වර්තමානයේ දී සාකච්ඡාවට ලක් වෙමින් පවතින රාමු තුන ම සාර්ථක කර ගැනීමට නම් සංවර්ධන තීරණ සමග වෙළී ගෙන ඒවා තුළින් ගලා යන එකිනෙකට සහයෝගී නිසි ආපදා අවදානම් කළමනාකරණ කට්ටලයක් අත්‍යවශ්‍ය බව යි. ආපදා අවදානම් සාර්ථක ලෙස කළමනාකරණය නොකළ හොත් තිරසර සංවර්ධනය සැබවින් ම තිරසර නොවනු ඇත.

# ප්‍රධාන සොයා ගැනීම්


## ආපදා හානි සැලකිය යුතු මට්ටමක පවතී

එක්සත් ජාතීන්ගේ සාමාජික රාජ්‍යයන් ස්වාභාවික ආපදා අවම කිරීමේ ජාත්‍යන්තර දශකය (IDNDR) සම්මත කර විසිපස් වසරක් ද හියෝගෝ ක්‍රියා රාමුව (HFA) සම්මත කර දස වසරක් ද ගත වී ඇතත් ගෝලීය ආපදා අවදානම සැලකිය යුතු ලෙස අඩු වී නැත. ආපදා කළමනාකරණයෙහි ලා සිදු වූ වැඩි දියුණු වීම් සමහර රටවල මරණ සංඛ්‍යා විස්මිත ලෙස පහත වැටීමට තුඩු දී තිබෙන නමුත් ආපදා නිසා සිදු වන ආර්ථික හානි දැන් සෑම වසරක දී ම එ.ජ. ඩොලර් බිලියන 250 හා එ.ජ. ඩොලර් බිලියන 300 අතර වූ සාමාන්‍යයක් කරා ළඟා වෙමින් පවතී.[3] වඩාත් තීරණාත්මක කරුණ වන්නේ පහළ හා මැදි ආදායම් රටවල දී විශාල අවදානම් ආශ්‍රිත මරණ සංඛ්‍යා හා ආර්ථික හානි ඉහළ යමින් පැවතීම යි.

## ආපදා පිරිවැය ප්‍රධාන රෝගවල පිරිවැයට සම වන අතර ආර්ථික හා සමාජීය අසීරුතාවයකි.

ආර්ථික සංවර්ධනය හා සමාජ ප්‍රගතිය *ඇති කිරීම* සඳහා අවශ්‍ය කාලය විස්තර වන මිම්මක් සම්පාදනය වන බැවින් ආපදාවල බලපෑම වඩා සාර්ථක ලෙස විදහා දැක්වීමට මානව ජීව වර්ෂ පිළිබඳ සංකල්පය යොදා ගත හැකි ය. 1980 සහ 2012 අතරතුර සෑම වසරක ම ජාත්‍යන්තරව වාර්තා වූ ආපදාවලින් මානව ජීව වර්ෂ මිලියන 42ක් පමණ අහිමි වූ අතර මෙය ක්ෂය රෝගය වැනි රෝග නිසා ඇති වූ පසුබෑමට සමාන පසුබෑමක් සංවර්ධනයෙහි ලා ඇති කළේ ය.[5]

**1 වන රූපය** ආදායම් කාණ්ඩ අනුව ගත් විට ජනගහනයට සාපේක්ෂව අහිමි වූ ජීව වර්ෂ පංගුව, 1990-2012




*(මූලාශ්‍රය: UNISDR, 2014 Noy දත්ත අනුව[4])*

මෙම සංඛ්‍යාවලින් පෙන්නුම් කෙරෙන්නේ ආපදා හානි ලෙඩරෝග තරමට ම ආර්ථික සංවර්ධනයට හා සමාජ ප්‍රගතියට තීරණාත්මක අභියෝගයක් බව නම් එය අසමාන ලෙස බෙදාහදා ගැනෙන අභියෝගයක් බව ද ඒවායින් පෙන්නුම් කෙරේ. ආපදා නිසා සිදු වූ මුළු ජීව වර්ෂ හානියෙන් සියයට 90කටත් වඩා විසිර තිබෙන්නේ පහළ හා මැදි ආදායම් රටවල ය (1 රූපය).

## ගෝලීය අවදානම සැලකිය යුතු ආවස්ථික පිරිවැයකට තුඩු දෙයි

ඓතිහාසික හානිවලට ඉතිහාසය පැහැදිලි කළ හැකි වුවත් ඒවා හැම විට ම අනාගතයට යහපත් මග පෙන්වීමක් නො කරයි. ඇති විය හැකි බොහෝ ආපදා තව මත් ඇති වී නැත. නව ගෝලීය අවදානම් තක්සේරුවක්[6] වර්තමාන පාරිසරික තත්ත්වය තුළ දී භූමිකම්පා, සුනාමි, නිවර්තන සුළි කුණාටු හා ගංවතුර ගැලීම් නිසා සිදු වන සාමාන්‍ය වාර්ෂික හානිය (AAL) දැන් තක්සේරු කෙරෙන්නේ එ.ජ. ඩොලර් බිලියන 314ක් ලෙස බව අවධාරණය කරයි. සාමාන්‍ය වාර්ෂික හානිය (AAL) යන්න රටවල් වසරක් පාසා අනාගත ආපදා හානි ආවරණය කිරීම සඳහා වෙන් කළ යුතු මුදල් ප්‍රමාණය ලෙස අර්ථ නිරූපණය කළ හැකි අතර ඒ අනුව ඉන් නියෝජනය වන්නේ අසම්භාව්‍ය (අහඹු) බැරකමක් රාශිභූත වීමකි. මෙම සම්පත් සංවර්ධනයට අදාළ වන තීරණාත්මක ආයෝජනයන් සඳහා යොදා ගත හැකි බැවින් මෙය සැලකිය යුතු ආවස්ථික පිරිවැයක් වේ.

## අපේක්ෂිත අනාගත හානි පහළ ආදායම් රටවල ආර්ථික සංවර්ධනයට හා සමාජ ප්‍රගතියට තර්ජනය කරයි

මෙම අවදානම ලෝක ජනගහනය අතර සම සේ බෙදී ගිය හොත් එය වැඩ කරන වයසේ පසු වන සෑම පුද්ගලයෙකු ම වාර්ෂිකව එ.ජ. ඩොලර් 70කට ආසන්න හානියක් අත්විඳීමට[7] හෝ දරිද්‍රතා රේඛාවෙන් පහළ ජීවත් වන ජනයාගේ දෛමසක ආදායම අහිමි වීමට[8] සමාන වනු ඇත. මෙමගින් නියෝජනය වන්නේ දැනට මත් ජීවත් වීම සඳහා දෛනිකව අරගලයක යෙදී සිටින ජනයා සිය පැවැත්ම සම්බන්ධයෙන් ම අවදානමකට මුහුණ දීමකි.

ආපදා අවදානම මගින් ප්‍රාග්ධන ආයෝජන හෝ සමාජ වියදම් මට්ටම් වැනි ආර්ථික මිනුම්වල සැලකිය යුතු පංගුවක් නියෝජනය වන තැන්වල දී සංවර්ධන අභියෝගය පැහැදිලිව දිස් වන තත්ත්වයට පත් වේ. උදාහරණයක් ලෙස වඩා ඉහළ ආදායම් රටවල් කරන වාර්ෂික සමාජ වියදම පහළ ආදායම් රටවල් කරන වියදමේ 400 ගුණයක් තරම් ය. එහෙත් පහළ ආදායම් රටවල දී සාමාන්‍ය වාර්ෂික හානිය සමාජ වියදමෙන් සියයට 22ක් පමණ වන නමුත් ඉහළ ආදායම් රටවල දී එය සියයට 1.45ක් පමණකි (2 රූපය).


එම නිසා ආපදා අවදානම අවම නොකළ හොත් මෙම රටවලට සිය සංවර්ධන පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම පිණිස සමාජ රැකවරණය, මහජන සෞඛ්‍යය හා නිදහස් අධ්‍යාපනය සඳහා අත්‍යවශ්‍ය ආයෝජනයන් කිරීමට නොහැකි වනු ඇත.

## සංවර්ධනය වෙමින් පවතින කුඩා දිවයින් රාජ්‍යයන් තුළ තිරසර සංවර්ධනය

සංවර්ධනය වෙමින් පවතින කුඩා දිවයින් රාජ්‍යයන්හි (SIDS) අපේක්ෂිත අනාගත ආපදා හානි සංසන්දනාත්මකව බෙහෙවින් ඉහළ මට්ටමක පවතිනවා පමණක් නො ව ඒවායින් එම රටවල පැවැත්මට තර්ජනයක් ද එල්ල වේ. උදාහරණයක් ලෙස යුරෝපය හා මධ්‍යම ආසියාව සමග සසඳන විට සංවර්ධනය වෙමින් පවතින කුඩා දිවයින් රාජ්‍යයන් ඊට සංසන්දනාත්මකව සෑම වසරක දී ම සිය ප්‍රාග්ධන තොගයෙන් 20 ගුණයකට වඩා අහිමි කර ගනු ඇතැයි අපේක්ෂා කෙරේ. ප්‍රාග්ධන ආයෝජනයට හෝ සමාජ වියදමට සාපේක්ෂව ගත් විට සංවර්ධනය වෙමින් පවතින කුඩා දිවයින් රාජ්‍යයන්හි සිදු වනු ඇතැයි අපේක්ෂිත හානි ද වෙනත් කලාපවලට වඩා ඉහළ මට්ටමක පවතී.

සංවර්ධනය වෙමින් පවතින කුඩා දිවයින් රාජ්‍යයන් හතරක් තුළ වාර්ෂිකව නිවර්තන සුළි කුණාටුවලින් ඇති විය හැකි අනාගත ආපදා හානි ආවරණය කිරීම

**2 වන රූපය** සමාජ වියදමට සංසන්දනාත්මකව භූමිකම්පා, ගංවතුර ගැලීම්, නිවර්තන සුළි කුණාටු හා සුනාමි නිසා ඇති විය හැකි යැයි තක්සේරු කර තිබෙන අනාගත හානිය




*(මූලාශ්‍රය: UNISDR ගෝලීය අවදානම් තක්සේරුවේ හා ලෝක බැංකුවේ දත්ත අනුව)*

සඳහා වසරක් පාසා වෙන් කළ යුතු සම්පත් ප්‍රමාණය සැබවින් ම එම රටවල මුළු වාර්ෂික සමාජ වියදම ඉක්මවන අතර (3 රූපය) තවත් රටවල් පහක් තුළ සාමාන්‍ය වාර්ෂික හානිය ඒවායේ ආණ්ඩු වර්තමානයේ දී අධ්‍යාපනය, සෞඛ්‍යය හා සමාජ රැකවරණය සඳහා වැය කිරීමට සමත් වන හෝ වැය කිරීමට අපේක්ෂා කරන වියදමෙන් සියයට 50කට වැඩි ප්‍රමාණයකට සමාන ය.


## කැරිබියානු ද්‍රෝණිය තුළ දේශගුණික විපර්යාසය නිසා වැඩි වන ආපදා අවදානම

දේශගුණික විපර්යාසය මෙම අපේක්ෂිත අනාගත හානි කෙරෙහි සැලකිය යුතු බලපෑමක් කරනු ඇත. උදාහරණයක් ලෙස කැරිබියානු ප්‍රදේශයේ දී දේශගුණික විපර්යාසය නිසා 2050 වන විට අපේක්ෂිත වාර්ෂික හානි සඳහා එ.ජ. ඩොලර් බිලියන 1.4ක අමතර මුදලක් දායක කිරීමට සිදු වනු ඇත (4 රූපය). මෙම සංඛ්‍යාවෙන් නියෝජනය වන්නේ වැඩි වන සුළඟ ආශ්‍රිත හානි පමණක් වන අතර මුහුදු මට්ටම ඉහළ යාම නිසා හට ගන්නා කුණාටු වඩ දිය නිසා ඇති වන අමතර හානි ඊට ඇතුළත් නො වේ.

දේශගුණික විපර්යාසයත් සමග හොන්ඩුරාස් දිවයින මුහුණ දෙන අවදානම දෙගුණ වන අතර ට්‍රිනිඩෑඩ් හා ටොබාගෝ දූපත්වල දී එම අවදානම පස් ගුණයකි. එහෙත් මෙක්සිකෝව අවදානමේ අඩු වීමක් අත්දකිනු ඇති අතර ඉන් අවධාරණය වන්නේ දේශගුණික විපර්යාසයේ බලපෑම රටවල් අතර සමව බෙදී නොයන බව හා විවිධ රටවල් පීඩාවට පත් වන්නේ වෙනස් ආකාරවලට බව යි.

**නිවර්තන සුළි කුණාටු**

**3 වන රූපය** සංවර්ධනය වෙමින් පවතින කුඩා දිවයින් රාජ්‍යයන් තුළ ප්‍රාග්ධන තොගය, ආයෝජනය හා සමාජ වියදම සමග සසඳන විට නිවර්තන සුළි කුණාටු නිසා ඇති වනු ඇතැයි තක්සේරු කර තිබෙන අනාගත හානිය




*(මූලාශ්‍රය: UNISDR, ගෝලීය අවදානම් තක්සේරුවේ හා ලෝක බැංකුවේ දත්ත අනුව)*

## දේශගුණික විපර්යාසය නිසා කෘෂිකාර්මික ඵලදායිතාව කෙරෙහි ඇති වන අසමාන බලපෑම්


IPCC ආයතනය පවසන පරිදි "දේශගුණික විපර්යාසය අප්‍රිකාව පුරා ප්‍රධාන ධාන්‍ය වගාවන්හි අස්වනු කෙරෙහි සමස්ත සෘණාත්මක බලපෑමක් ඇති කිරීමට බෙහෙවින් ඉඩ තිබෙන අතර අස්වනු අඩු වන තරමෙහි ප්‍රබල කලාපීය විවිධත්වයක් පැවතිය හැකි ය."[9] මෙම කලාපීය විවිධත්වය තුළ නැගෙනහිර අප්‍රිකාවේ බඩ ඉරිඟු නිෂ්පාදනය වැඩි වීම් පවා ඇතුළත් විය හැකි ය.

කෙන්යාව, මලාවි හා නයිජර් යන රාජ්‍යයන්හි දී කෘෂිකර්මයෙන් ලැබෙන ආදායම දළ දේශීය නිෂ්පාදිතයේ (දළ.දේ.නි.) සැලකිය යුතු පංගුවක් වන බැවින් එය එම රටවල් තුන තුළ වැදගත් නිෂ්පාදන අංශයකි.

ආසන්න අනාගතයේ දී ඇති වන දේශගුණික විපර්යාස තත්ත්වයන් පදනම් කර ගෙන මලාවි රාජ්‍යය තුළ නියඟය නිසා සිදු වන බඩ ඉරිඟු නිෂ්පාදන හානිය නිරපේක්ෂ අගය හා දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස යන දෙයාකාරයෙන් ම වැඩි වනු ඇතැයි අපේක්ෂා කෙරේ.[10] කෘෂිකර්මය මලාවි රාජ්‍යයේ දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 30කට දායක වන තත්ත්වය තුළ මෙමගින් රට ජාතික ආර්ථිකය මෙන් ම දරිද්‍රතාව අතින් පහළ ම අඩියකට පත් විය හැකි ය.

එහෙත් කෘෂිකර්මය පිළිවෙළින් දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 30ක් හා 38ක් ජනනය කරන කෙන්යාවේ දී හා නයිජර්හි දී එම දේශගුණික වෙනස් වීම ම හානි සැබවින් ම පහත හෙළනු ඇත.

**4 වන රූපය** කැරිබියානු ද්‍රෝණියේ දී දේශගුණික විපර්යාසය නිසා ඇති වන අමතර හානි




*(මූලාශ්‍රය: UNISDR, ගෝලීය අවදානම් තක්සේරුවේ දත්ත අනුව)*


## පුළුල් අවදානම දරිද්‍රතා සාධකයක් ලෙස

පුළුල් අවදානම තීව්‍ර අවදානමට වෙනස් ය. එය භූමිකම්පා විභේද රේඛාවන්ට හා සුළි කුණාටු මංපෙත්වලට වඩා අසමානතාව හා දරිද්‍රතාව වැනි සාධකවලට සමීපව සම්බන්ධ ය. එහෙත් පුළුල් අවදානම නිර්මාණය වන්නේ සංවර්ධනය ආශ්‍රිත සාධක නිසා ම බැවින් ආපදා අවදානම් අවම කිරීමෙහි ලා කෙරෙන නිසි ආයෝජනයන් මගින් කළමනාකරණය කිරීමට හා වැළැක්වීමට හැකි වේ.

බොහෝ හානිවලට වගකිව යුත්තේ පුළුල් අවදානම වන අතර ඉන් කියැවෙන්නේ විශේෂයෙන් ම පහළ හා මැදි ආදායම් රටවල් තුළ නිවාස, පාසල්, සෞඛ්‍ය පහසුකම්, මාර්ග හා ප්‍රාදේශීය යටිතල පහසුකම් වැනි සංවර්ධන වත්කම් බාදනය වෙමින් පවතින බව යි (6 රූපය).


පසු ගිය දශකය තුළ දී දැන් දත්ත ලබා ගත හැකි රටවල් හා භූමි ප්‍රදේශ 85ක දී පුළුල් අවදානම නිසා ඇති වූ හානිය එ.ජ. ඩොලර් බිලියන 94ක් විය.[11] රක්ෂිත හානි සහ තීව්‍ර ආපදා නිසා ඇති වන හානි සාමාන්‍යයෙන් තක්සේරු කෙරෙන අතර වාර්තා වේ. එහෙත් පුළුල් අවදානමේ පිරිවැය සාමාන්‍යයෙන් වාර්තා නො වේ. ක්‍රියාවලිය තුළ දක්නට ලැබෙන වැදගත් දරිද්‍රතා ලක්ෂණයක් නම් මෙම හානි දරා ගන්නේ පීඩාවට පත් ජනයා විසින් වීම යි.

**5 වන රූපය** දේශගුණික විපර්යාසයට ලක්ව තිබෙන තත්ත්වය තුළ එය සැලකිල්ලට ගත් විට නියඟය නිසා කෙන්යාව, මලාවි හා නයිජර් යන රාජ්‍යයන්හි බඩ ඉරිඟු හා මෙනේරි වගාවන්ට සිදු වන සාමාන්‍ය වාර්ෂික හානිය




(*මූලාශ්‍රය: Jayanthi, 2014* [12])

**6 වන රූපය** 1990 සිට විශාල අවදානම හා තීව්‍ර අවදානම නිසා සිදු වූ හානිය




(*මූලාශ්‍රය: UNISDR, ජාතික හානි පිළිබඳ දත්ත පදනම්වල දත්ත අනුව*)


## බහුවිධ අවදානම්

ප්‍රාග්ධන තොගයේ හා ඉතිරි කිරීම්වල සිදු වන සාමාන්‍ය වාර්ෂික හානිය ඉහළ අනුපාතයක් ගන්නා රටවල දී ආපදාවන් දරුණු ආර්ථික බිඳ වැටීම්වලට තුඩු දිය හැකි ය. ප්‍රාග්ධන ආයෝජනයේ අවදානම ඉහළ අනුපාතයක් ගන්නා රටවල දී අනාගත ආර්ථික වර්ධනය අනතුරට ලක් විය හැකි ය. සමාජ වියදමේ අවදානම ඉහළ අනුපාතයක් ගන්නා රටවල දී සමාජ සංවර්ධනය අභියෝගයට ලක් විය හැකි ය.

රටවල් ගණනාවක මේ තත්ත්වයන් තුන ම දැක ගත හැකි ය. ඉන් හැඟෙන්නේ ආපදා අවදානමට ඒවායේ සංවර්ධන හැකියාව බහුවිධ පැතිකඩවල් ඔස්සේ බරපතළ ලෙස දුර්වල කළ හැකි බව යි (7 රූපය). මෙය මැඩගස්කරය හා හයිටිය වැනි පහළ ආදායම් රටවලට පමණක් නො ව හොන්ඩුරාස්, ජැමෙයිකාව හා පිලිපීනය වැනි මැදි ආදායම් රටවලට සහ ග්‍රීසිය වැනි ඉහළ ආදායම් රටවලට ද අභියෝගයකි.

පිලිපීනය, ෆීජී, හොන්ඩුරාස් හා මැඩගස්කරය වැනි

**7 වන රූපය** ආපදා අවදානම නිසා සංවර්ධන හැකියාවට ඇති වන බලපෑම්




*(මූලාශ්‍රය: UNISDR, ගෝලීය අවදානම් තක්සේරුවේ හා ලෝක බැංකුවේ දත්ත අනුව)*

රටවල් සමග සසඳන විට ජැමෙයිකාව හා ග්‍රීසිය මුහුණ දෙන අවදානම බෙහෙවින් පහළ මට්ටමක පැවතියත් සංවර්ධනයෙහි ලා ඇති වන සෘණාත්මක බලපෑම් අතිශයින් සමාන ය. එහෙත් නොයෙක් රටවල් සමහර පැතිකඩවල දී අනෙක් පැතිකඩවල දීට වඩා බලපෑමට ලක් වේ. ග්‍රීසිය මුහුණ දෙන ප්‍රධාන අභියෝගය ආර්ථික වර්ධනයට සම්බන්ධ අතර පිලිපීනය මුහුණ දෙන ප්‍රධාන අභියෝගය සමාජ සංවර්ධනයට සම්බන්ධ වූවකි.


## රාජ්‍ය මූල්‍ය ප්‍රත්‍යතාව අභියෝගයට ලක් වේ

රටකට සිය අපේක්ෂිත වාර්ෂික හානි සඳහා අරමුදල් සම්පාදනය කළ හැකි වුව ද කලාතුරකින් නමුත් ඇති වන ආන්තික හානි සඳහා පිළියම් යෙදීමට අවශ්‍ය කරන ආර්ථික හා රාජ්‍ය මූල්‍ය ප්‍රත්‍යතාව නො පැවතිය හැකි ය. ඉහළ ආදායම් රටවල දී ආර්ථික හානිවලින් සැලකිය යුතු ප්‍රමාණයක් රක්ෂණය කොට තිබෙන අතර එමගින් රාජ්‍ය මූල්‍ය ප්‍රත්‍යතාව  ශක්තිමත් වේ. එහෙත් ඌන සංවර්ධිත රටවල් (least developed countries – LCDs) හා සංවර්ධනය වෙමින් පවතින කුඩා දිවයින් රාජ්‍යයන් ඇතුළු පහළ ආදායම් හා කුඩා ආර්ථිකයන් සහිත රටවලින් බොහොමයක් ආන්තික හානිවල දී දරුණු අභියෝගවලට මුහුණ දෙනු ඇත.

මෙම රටවල දී අවදානම්වලින් බොහොමයක් රක්ෂණය කොට නැති අතර හානි දරා ගැනීමට, ප්‍රකෘතිමත් වීමට හා යළි ගොඩ නැගීමට ඉඩ සැලසෙන හදිසි අවස්ථා අරමුදල් සම්පාදනය කර ගැනීමට අවශ්‍ය මූල්‍ය සංචිත හෝ ප්‍රවේශය ආණ්ඩු සතුව නො පවතී. විශේෂයෙන් ම විශාල අයවැය හිඟයන් සහිත රටවල් සාමාන්‍යයෙන් විශාල ආපදා හානිවලට පිළියම් යෙදීම පිණිස රාජ්‍ය ආදායමෙන් අරමුදල් යොමු කිරීමට අසමත් වන බැවින් බදුකරණය, ජාතික සහ ජාත්‍යන්තර ණය, විදේශීය සංචිත, දේශීය බැඳුම්කර, ආධාර හා අවදානම් මූල්‍යකරණ මෙවලම් ඇතුළු වෙනත් යන්ත්‍රණයන් යොදා ගැනීමේ අවශ්‍යතාව මතු වේ.

ඒ නිසා ම බොහෝ රටවල් වසර 100ක් තුළ ඇති වන එක් හානියක දී පවා ආතති පරීක්ෂණයෙන් සමත් නොවනු ඇත (8 රූපය). උදාහරණයක් ලෙස කැනඩාව, එක්සත් ජනපදය, ජපානය හා යුරෝපා රටවල් වසර 100ක් තුළ ඇති වන එක් හානියක දී මූල්‍ය පරතරයකට මුහුණ නොදෙනු ඇත. එහෙත් ඇල්ජීරියාව, චිලිය, ග්‍රීසිය, ඉන්දුනීසියාව, ඉරානය, නිකරගුවාව, පකිස්ථානය හා පිලිපීනය වැනි විවිධ රටවල රාජ්‍ය මූල්‍ය ප්‍රත්‍යතාව දරුණු අභියෝගයකට ලක් වනු ඇත.

**8 වන රූපය** වසර 100ක් තුළ ඇති වන එක් සිදුවීමක දී මූල්‍ය පරතරයකට මුහුණ දෙන රටවල්




(මූලාශ්‍රය: *Williges et al., 2014*[13])

## ශක්තිමත් කළ ආපදා කළමනාකරණය

හියෝගෝ ක්‍රියා රාමුව යටතේ ආපදා අවදානම් අවම කිරීම සඳහා වූ ආයතනික හා ව්‍යවස්ථාදායක විධිවිධාන ශක්තිමත් කිරීම යනු රටවල් කෙටි කාලයක් තුළ දී පමණක් සැලකිය යුතු ප්‍රගතියක් වාර්තා කර තිබෙන ක්ෂේත්‍රයකි (9 රූපය). හියෝගෝ ක්‍රියා රාමුවේ නිරීක්ෂකය (HFA Monitor)[14] පෙන්වා දෙන පරිදි මේ වන විට රටවල් 100කට වැඩි සංඛ්‍යාවක් ආපදා අවදානම් අවම කිරීම සඳහා ජාතික ආයතනික විධිවිධාන යොදා ඇත. 2007 වසරේ සිට රටවල් 120කටත් වඩා නීතිමය හෝ ප්‍රතිපත්තිමය ප්‍රතිසංස්කරණවලට ලක් වී ඇත, රටවල් 190කටත් වඩා ආපදා අවදානම් අවම කිරීම සඳහා මධ්‍යස්ථාන පිහිටුවා ඇත, රටවල් 85ක් ජාතික බහුපාර්ශ්වීය වේදිකා නිර්මාණය කර ඇත.

කෙසේ වුව ද හියෝගෝ ක්‍රියා රාමුවේ ප්‍රගති වාර්තාවලින් නොකඩවා අවධාරණය කෙරෙන්නේ ආපදා කළමනාකරණය සම්බන්ධ හැකියාවන් ශක්තිමත් කිරීමෙහි ලා අඛණ්ඩව බොහෝ සම්පත් හා පරිශ්‍රමයන් කැප කළ යුතු බව යි.

අවදානම් කළමනාකරණය හා අවම කිරීම සඳහා අනෙකුත් අංශ විසින් ප්‍රතිපත්ති, මිනුම් දඬු, ප්‍රමිතීන් හා රෙගුලාසි යොදා ගනු ලබන බව සහතික කිරීම සම්බන්ධ ප්‍රගතිය වඩා මධ්‍යස්ථ වේ. එමෙන් ම සමායතනික සමාජ වගකීම පිළිබඳව අවධානය යොමු කිරීම හරහා හැරුණු විට පෞද්ගලික අංශයත් සමග විධිමත් සම්බන්ධයක් පැවතී තිබෙන්නේ සුළු වශයෙනි.


## අවදානම් තොරතුරු හා දැනුවත්කම

හියෝගෝ ක්‍රියා රාමුව සම්මත කෙරුණු තැන් සිට ආපදා හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සම්බන්ධයෙන් කෙරෙන ආයෝජනය ද සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇත (10 රූපය). එහෙත් මෙම පරිශ්‍රමයන් මගින් කුටුම්බයන්, ප්‍රජාවන්, ව්‍යාපාරයන් සහ දේශීය හා ජාතික ආණ්ඩු සිය ආපදා අවදානම් කළමනාකරණය කරන ආකාරය කෙරෙහි බලපාන සමාජීය හා ආර්ථික සීමාවන් හෝ අවස්ථාවන් සම්පාදනය කෙරෙන්නේ කලාතුරකින් බැවින් එම පරිශ්‍රමයන්හි ප්‍රතිඵලයක් ලෙස අනිවාර්යයෙන් ම *නිවාරණ සංස්කෘතියක්* බිහි වී නැත.[15]

මීට සමාන්තරව හා සැම මට්ටමක දී ම අවදානම් තොරතුරු නිෂ්පාදනය ද සැලකිය යුතු ලෙස වැඩි වී ඇති අතර ඒ සමග ම අවදානම් ආදර්ශන ප්‍රජාවන් පිළිබඳ පරිචය, පවත්නා අවදානම් දත්ත සහ දත්ත අවදානම් තොරතුරු බවට පරිවර්තනය කිරීමේ විද්‍යාත්මක හා තාක්ෂණික හැකියාවන් සම්බන්ධයෙන් ද සමාන වර්ධනයක් සිදු වී ඇත.


එහෙත් නිෂ්පාදනය කෙරෙන අවදානම් තොරතුරුවලින් සංවර්ධනය හෝ ආපදා අවදානම් අවම කිරීම සැබවින් ම දැනුවත් වන බවට සාක්ෂි තිබෙන්නේ සුළු වශයෙනි. අවදානම් තොරතුරු නිෂ්පාදනය කිරීම සාමාන්‍යයෙන් නොකඩවා ම සැපයුමෙන් තල්ලුව ලබනු ඇති අතර පරිශීලනය කිරීමට ඉඩ තිබෙන විවිධ පරිහරණය කරන්නන් උදෙසා එම තොරතුරු අවදානම් දැනුම බවට පරිවර්තනය කෙරෙන්නේ කලාතුරකිනි.

**9 වන රූපය** ආපදා අවදානම් පාලනය හා ප්‍රතිපත්ති සකස් කිරීම සම්බන්ධ ප්‍රගතිය




*(මූලාශ්‍රය: UNISDR, හියෝගෝ ක්‍රියා රාමු නිරීක්ෂකයේ දත්ත අනුව)*

**10 වන රූපය** ආපදා හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සම්බන්ධ ප්‍රගතිය




*(මූලාශ්‍රය: UNISDR, හියෝගෝ ක්‍රියා රාමු නිරීක්ෂකයේ දත්ත අනුව)*

## කල් තියා අනතුරු ඇඟවීමේ පද්ධති

කල් තියා අනතුරු ඇඟවීමේ පද්ධති සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම යනු හියෝගෝ ක්‍රියා රාමුව අතරතුර දී සැලකිය යුතු ප්‍රගතියක් අත් කර ගෙන තිබෙන එක් ක්ෂේත්‍රයකි. බංග්ලාදේශය, චිලිය, ඉන්දියාව, පිලිපීනය හා වෙනත් රටවලින් ලැබෙන සාර්ථකත්වය පිළිබඳ කතාපුවත්වලින් පෙන්නුම් කෙරෙන්නේ කාලීන හා සාර්ථක අනතුරු ඇඟවීම් හා සන්නිවේදනයත් අවදානම් තොරතුරු හා පෙර සූදානම් වුණු ජනගහනයත් එකට එක් වූ විට ආපදාවලින් සිදු වන මරණ සංඛ්‍යාව සැලකිය යුතු ලෙස අවම කළ හැකි බව යි.

නිරීක්ෂණය සහ කල් තියා දැනුම් දීම සම්බන්ධ ක්‍රම එන්න එන්න ම වැඩි දියුණු වීම නිසා ඉහළ ආදායම් රටවල දී හා කලාපීය මට්ටමේ දී නිවර්තන සුළි කුණාටු, කුණාටු, ගංවතුර, නියඟ, සුනාමි හා වෙනත් ආපදා පිළිබඳව කෙරෙන කල් තියා අනතුරු ඇඟවීම්වල නිරවද්‍යතාව බෙහෙවින් වැඩි දියුණු වී ඇත. ඒ සමග ම අවසාන පරිහරණය කරන්නන් වෙත කල් තියා අනතුරු ඇඟවීම් සන්නිවේදනය කිරීම ගෝලීය සබැඳියාව විශේෂයෙන් ම ජංගම දුරකථන භාවිතය වේගයෙන් වැඩි වීම කරණ කොට ගෙන පරිවර්තනයකට ලක් වී ඇත.

කෙසේ වුව ද විශේෂයෙන් ම පහළ ආදායම් රටවල දී ආපදා නිරීක්ෂණය සම්බන්ධයෙන් තව මත් විශාල හිදැස් පවතින අතර අවශ්‍ය තාක්ෂණික හා ආයතනික යටිතල පහසුකම් නඩත්තු කිරීම සම්බන්ධයෙන් එම රටවලට දුෂ්කරතා පැවතිය හැකි ය. පවත්නා අවදානම් තොරතුරු කල් තියා අනතුරු ඇඟවීම් සමග ඒකාබද්ධ කිරීම තව මත් දුර්වල මට්ටමක පවතින අතර ඉන් අදහස් වන්නේ සියලු අනතුරු ඇඟවීම් අවදානමේ මට්ටම පිළිබඳ තොරතුරු සම්පාදනය නොකරන බව යි. එසේ ම අනතුරු ඇඟවීම් පදනම් කර ගෙන ක්‍රියා කිරීම සඳහා ප්‍රාදේශීය වශයෙන් පවතින පෙර සූදානමේ මට්ටම් ද තව මත් අතිශයින් අසමාන ය.

## ආපදා පෙර සූදානම


හියෝගෝ ක්‍රියා රාමුවේ ප්‍රගති වාර්තා අවධාරණය කරන්නේ රටවල්වලින් බහුතරයක් ආපදා පෙර සූදානමට අදාළව සැබෑ වැඩි දියුණු කිරීම් කර තිබෙන බව හා බොහෝ අවස්ථාවල දී ශක්තිමත් කළ කලාපීය යන්ත්‍රණයන්ගේ සහාය ද ඇතිව අත්‍යවශ්‍ය හැකියාවන් ශක්තිමත් කිරීමෙහි ලා විශාල ආයෝජනයන් කර තිබෙන බව යි. හියෝගෝ ක්‍රියා රාමුව අතරතුර දී - බංග්ලාදේශය, මොසැම්බික්, ඉන්දියාව හා කියුබාව තුළ ආපදා මරණ සංඛ්‍යාව සැලකිය යුතු ලෙස අවම කිරීම වැනි - සාර්ථකත්වය පිළිබඳ කතාපුවත් අසන්නට ලැබීම ශක්තිමත් කළ පෙර සූදානම ද වඩා සාර්ථක කල් තියා අනතුරු ඇඟවීමේ යන්ත්‍රණයන් ද එකට එක් වීමේ ප්‍රතිඵලයක් ලෙස සැලකිය හැකි ය.

කෙසේ වුව ද සමහර පහළ ආදායම් රටවල් විශේෂයෙන් ම ප්‍රාදේශීය මට්ටමේ දී අවශ්‍ය පෙර සූදානම් මට්ටම වර්ධනය කර ගැනීමේ දී හා නොකඩවා පවත්වා ගැනීමේ දී තව මත් අභියෝගයන්ට මුහුණ දෙයි. එමෙන් ම ප්‍රාදේශීය හැකියාවන් දුබල වීම හෝ නොපැවතීම ප්‍රබල ජාතික ආපදා කළමනාකරණ විධිවිධාන පවා දුර්වල කරයි. මේ සමග පෙර සූදානම් සැලසුම් හා ප්‍රතිචාරය තුළින් පීඩාවට පත් ජනතාව පිළිබඳව කල් තියා ඇති කර ගත් අදහස් පිළිබිඹු වීම හෝ එම සැලසුම් හා ප්‍රතිචාරය ප්‍රාදේශීය අවදානම් තත්ත්වයන්හි සුවිශේෂතා හා සංකීර්ණත්වය සැලකිල්ලට ගැනීමට අසමත් වීම නිසා ප්‍රාදේශීය මට්ටමේ දී අනපේක්ෂිත හෝ ඍණාත්මක ප්‍රතිවිපාක ඇති වීම ද සිදු විය හැකි ය.

## වඩා යහපත් අයුරින් යළි ගොඩ නැඟීම

ආපදා අවදානම් අවම කිරීමේ නොවෙන් කළ හැකි කොටසක් ලෙස විස්තර කෙරෙන නමුත් හියෝගෝ ක්‍රියා රාමුවේ දී යථා තත්ත්වයට පත් කිරීම හා යළි

**11 වන රූපය** යථා තත්ත්වයට පත් කිරීම හා යළි ඉදි කිරීම සම්බන්ධ ප්‍රගතිය




*(මූලාශ්‍රය: UNISDR, හියෝගෝ ක්‍රියා රාමු නිරීක්ෂකයේ දත්ත අනුව)*

ඉදි කිරීම කෙරෙහි අවධානය යොමු වන්නේ සුළු වශයෙනි. එසේ ම ජාතික ස්වයං තක්සේරුවලින් පෙන්වා දෙන්නේ මෙම ක්ෂේත්‍රය තුළ ගෝලීය ප්‍රගතිය සීමා වී තිබෙන බව යි (11 රූපය).

සමාලෝචනවලින් පෙන්නුම් කෙරෙන්නේ සැබෑ ප්‍රගතිය අත් කර ගෙන තිබෙන්නේ අවශ්‍යතා තක්සේරු තුළට හා යථා තත්ත්වයට පත් කිරීමේ රාමු තුළට ආපදා අවදානම් අවම කිරීම ඇතුළත් කෙරෙන බව සහතික කිරීමේ දී බව යි. කෙසේ වුව ද යථා තත්ත්වයට පත් කිරීමේ මෙහෙයුම් සැලසුම්වල හා අයවැයවල සහ අවසානයේ දී ආපදා අවදානම් කළමනාකරණය සම්බන්ධ වඩා පුළුල් ප්‍රවිෂ්ටයක අඩංගු කළ හොත් මිස එවැනි තක්සේරු තුළට *වඩා යහපත් අයුරින් යළි ගොඩ නැගෙන්න* වැනි සටන් පාඨ ඇතුළත් කළ හැකි වන්නේ කලාතුරකිනි.

යථා තත්ත්වයට පත් කිරීම සම්පූර්ණ බව තහවුරු කර ගත් පසු බොහෝ රටවල් වඩා *යහපත් අයුරින් යළි ගොඩ නැගෙන්න* යන සටන් පාඨය තව දුරටත් යොදා නොගන්නා අතර ඒ වෙනුවට නැවතත් *සාමාන්‍ය පරිදි කටයුතු කරන්න* යන සටන් පාඨය යොදා ගනියි. මින් අවධාරණය කෙරෙන්නේ ආපදාවකින් පසුව විවෘත වන අවස්ථාවේ වාසිය ගැනීමත් නව සංවර්ධනය ආපදා අවදානම් නැවත නිර්මාණය කිරීම වෙනුවට වළක්වන හා මග හරින බව සහතික කිරීමත් කොතරම් දුෂ්කර ද යන්න යි.

## පදනම් වන අවදානම් සාධක කෙරෙහි අවධානය යොමු කිරීම

හියෝගෝ ක්‍රියා රාමුවේ 1 වන ක්‍රමෝපායාත්මක පරමාර්ථය සහ 4 වන ක්‍රියා ප්‍රමුඛතාව පදනම් වන අවදානම් කෙරෙහි අවධානය යොමු කිරීම සඳහා විශාල ඉඩකඩක් සම්පාදනය කරන නමුත් මෙම ප්‍රවිෂ්ටය *එතරම් ගමන් නොකළ මංපෙතක්* බවට පත් වී ඇත. මෙහි ප්‍රතිඵලයක් ලෙස සියලු සාක්ෂිවලින් ඇඟවෙන්නේ හියෝගෝ ක්‍රියා රාමුවේ 1 වන පරමාර්ථය – *ආපදා අවම කිරීම තිරසර සංවර්ධන ප්‍රතිපත්තිවලට හා සැලසුම්කරණයට ඒකාබද්ධ කිරීම* – සාක්ෂාත් කර ගෙන තිබෙන්නේ සීමිත ලෙස බව යි.

කෙසේ වුව ද මෙම පැහැදිලි ඌනතාව නිසා වඩා සංකීර්ණ යථාර්ථයක් වසන් වේ. සමාජ රැකවරණය, අවදානම් මූල්‍යකරණය, දේශගුණික විපර්යාසය, පරිසරය, ජලය, නගර සැලසුම් හා කළමනාකරණය සහ තිරසරතාව ආශ්‍රිත ඒවා ඇතුළු අනෙක් න්‍යාය පත්‍රයන් වේගයෙන් නවීකරණය වීම හා වැඩි දියුණු වීම විසින් සංවර්ධන ප්‍රතිපත්ති හා පරිචයන් පරිවර්තනය කෙරෙමින් පවතින අතර අවදානම් අවම කිරීමට අදාළව හියෝගෝ ප්‍රගති වාර්තාවල දී හසු කර ගෙන නැති ඍජු හෝ වක්‍ර සම ප්‍රතිලාභ ලැබෙමින් පවතී.

එහෙත් මෙම පරිවර්තනයන් සිදු වෙමින් පවතින්නේ අවදානම් වැඩි වන තත්ත්වයක් හමුවේ ය. එකිනෙකට බැඳුණු ගෝලීය සාධක හතරක් (ආපදාවලට නිරාවරණය වීම වැඩි වීම, අසමානතාව ඉහළ මට්ටම් කරා සේන්දු වීම, නාගරික සංවර්ධනය වේගවත් වීම හා පාරිසරික හායනය) කරණ කොට ගෙන දැරිය නොහැකි හා අන්තරායකර මට්ටම් දක්වා අවදානම් ඉහළ යා හැකි බවට දැන් වැඩි වැඩියෙන් සාක්ෂි ලැබෙමින් පවතී.


## ආර්ථික වත්කම් වඩ වඩාත් ආපදාවලට නිරාවරණය වීම

1990 හා 2010 අතරතුර දී ගෝලීය ද.දේ.නි. ඒකපුද්ගල ආදායම සියයට 122කින් වැඩි විය.[16] ආර්ථිකය වඩ වඩා ගෝලීය වන විට අඩු ශ්‍රම පිරිවැය, අපනයන වෙළඳ පොළවල් වෙත ප්‍රවේශය, යටිතල පහසුකම්, ස්ථාවරත්වය හා වෙනත් සාධක ඇතුළු සංසන්දනාත්මක වාසි පිරිනැමෙන ස්ථාන කරා ආයෝජන ගලා යාමේ නැඹුරුවක් ඇති වේ.

ආයෝජන පිළිබඳ තීරණ ගන්නා විට එම ස්ථානවල ආපදා මට්ටම සැලකිල්ලට ගන්නේ කලාතුරකිනි. වෙනත් ලෙසකින් කිව හොත් කෙටි කාලීන ලාභ ලැබීම පිණිස පමණ ඉක්මවා අවදානම නො සලකා හරිති. මෙහි ප්‍රතිඵලය වන්නේ ආපදාවන්ට ගොදුරු විය හැකි ප්‍රදේශ වෙත විශාල ප්‍රාග්ධන ප්‍රමාණයක් ගලා යාම සහ ආපදාවන්ට නිරාවරණය වී තිබෙන ආර්ථික වත්කම්වල වටිනාකම සැලකිය යුතු ලෙස ඉහළ යාම යි (12 රූපය).

මේ සමග ම අවදානම් කෙරෙහි සංවේදී රාජ්‍ය හා පෞද්ගලික ආයෝජන ප්‍රවර්ධනය කිරීම සඳහා සැලසුම් කළ නවීකාරක මුල පිරීම් පැන නැගීමට පටන් ගෙන ඇත. ප්‍රාදේශීය මට්ටමේ දී නිසි අවදානම් තොරතුරු නොමැති වීම හා හැකියාවන් දුර්වල වීම නිසා තව මත් අභියෝගයට ලක් වෙමින් පැවතියත් පේරු, කොස්ටාරිකාව, ගුවාතමාලාව හා පැනමාව වැනි ලතින් ඇමරිකානු රටවල් සිය රාජ්‍ය ආයෝජන

**12 වන රූපය** සෙ.මී. 60කින් පමණ මුහුදු මට්ටම ඉහළ යාමෙන් පසු මියාමි නගරය අද දිස් වන ආකාරය




(මූලාශ්‍රය: *Peter Harlem, FIU*[18])

සැලසුම්කරණ ක්‍රියාවලි තුළට ආපදා අවදානම ඇතුළත් කිරීමට අඛණ්ඩව පරිශ්‍රමයන් දරා තිබීම මීට උදාහරණයක් ලෙස දැක්විය හැකි ය.[17]

කෙසේ වුව ද මේ දක්වා සිදු වී තිබෙන්නේ අනාගත තිරසරතාව පිළිබඳ සැලකිලිමත් වීම්වලට වඩා කෙටි කාලීනව ප්‍රාග්ධනය සමුච්චය කර ගැනීම සඳහා පවතින අවස්ථාවලට වැඩි වැදගත්කමක් දීම යි. නොසැලකිලිමත්ව හා හිතාමතා යන දෙයාකාරයෙන් ම අවදානම් ජනනය කෙරෙන තත්ත්වය තුළ ඒවා සම්බන්ධයෙන් වග වීමක් නොමැතිකමෙන් අදහස් වන්නේ එම ප්‍රතිවිපාක පිළිබඳ වගකීම අවදානම් ජනනය වීමට තුඩු දුන් තීරණ මත පැවරෙන්නේ කලාතුරකින් බව යි. එසේ ම මෙම වගකීම් පැවරීමක් නොමැතිකම නිසා අවදානම් ජනනය කරන චර්යාවන් අඛණ්ඩව පැවතී ගෙන යාමට හිතුවක්කාර ලෙස දිරි දීම් කෙරෙන තත්ත්වයක් නිර්මාණය වේ.

නාගරික පද්ධතිවල, ගෝලීය සැපයුම් දාමයන්හි හා මූල්‍යමය ගලා යාම්වල අන්තර් සම්බන්ධිත භාවය වැඩෙන තත්ත්වය තුළ මින් ඇඟවෙන්නේ අවදානම් තක්සේරුවල වෙනසක් සිදු නොකළ හොත් ආපදා අවදානම වඩ වඩා පද්ධතිමය තත්ත්වයට පත් වනු ඇති බව යි.

## ගෝලීය අසමානතාව

### වැඩෙන අවදානම් අසමානතාව

ප්‍රාග්ධනය එක් තැනක රාශිභූත වීම සමාජීය හා භෞමික අසමානතාවන් ජනනය කරයි. ලෝක

වැඩිහිටි ජනගහනයේ ධනවත් ම සියයට 2 දැන් ගෝලීය ධනයෙන් සියයට 50කටත් වඩා තමන් සතු කර ගෙන සිටී.[19] එහෙත් පහළ ම සියයට 50 තමන් සතු කර ගෙන සිටින්නේ ගෝලීය ධනයෙන් සියයට 1කටත් අඩුවෙනි.[20] මින් කියැවෙන්නේ ගෝලීය ගිනි සංගුණකය (Gini coefficient) 0.89ක්[21] වන බව යි. එහි අර්ථය වන්නේ ලෝකය පරම අසමානතා මට්ටම් යැයි සැලකිය හැකි මට්ටම් කරා ළඟා වෙමින් සිටින බව යි.


මෙහි ප්‍රතිඵලය වී තිබෙන්නේ අවදානම් අවම කරන යටිතල පහසුකම් සඳහා කෙරෙන ආයෝජනය පහළ මට්ටම්වල පැවතීම ද සමාජීය හා පාරිසරික රැකවරණයක් නොමැතිකම ද ග්‍රාමීය හා නාගරික දරිද්‍රතාව ද ඇතුළු සාධක කරණ කොට ගෙන ප්‍රාග්ධනය සමුච්චය වීම ආශ්‍රිත සංසන්දනාත්මක වාසි භුක්ති නොවිඳින අංශ හා භූමි ප්‍රදේශ වැඩෙන අවදානම්වලට මුහුණ දීම යි. අවදානම් අසමානතාවේ භූගෝලීය පැතිරීම භූගෝලීය කලාප හා රටවල් අතර, රටවල් තුළ මෙන් ම නගර හා ප්‍රදේශ තුළ පවා සිදු වේ.

හියෝගෝ ක්‍රියා රාමුව අතරතුර දී කෘෂිකාර්මික, ආහාර හා සමාජ සුභසාධන අංශවල දී දරිද්‍රතාවට හා අසමානතාවට විසඳුම් සෙවීමෙහි ලා සැලකිය යුතු ප්‍රගතියක් අත් කර ගෙන ඇත. උදාහරණයක් ලෙස බොහෝ කලාපවල දී ආහාර සුරක්ෂිතතාව වැඩි දියුණු වෙමින් පවතින අතර සමාජ රැකවරණ ආවරණය වැඩි වෙමින් පවතී.[22] එහෙත් පුරවැසි අවශ්‍යතා සැපිරීම සඳහා දේශීය ආණ්ඩුවලට තිබෙන හැකියාවෙහි පවතින කැපී පෙනෙන වෙනස්කම් නිසා බොහෝ රටවල දී සමාජ රැකවරණය හෝ ආපදා අවදානම් අවම කිරීම සඳහා ආයෝජනය කිරීමේ හැකියාව සීමා වී ඇත (13 රූපය).

හියෝගෝ ක්‍රියා රාමුව අතරතුර දී අවදානම් මූල්‍යකරණය කුටුම්බය, ව්‍යාපාර හා රාජ්‍ය මූල්‍ය හැකියාව ශක්තිමත් කිරීමේ යන්ත්‍රණයක් ලෙස ද වැඩි වැඩියෙන් ආකර්ෂණයට ලක් වූ අතර එම ක්ෂේත්‍රයෙහි ලා සැලකිය යුතු ප්‍රගතියක් අත් කර ගෙන ඇත. ප්‍රකෘතිමත් වීමේ හැකියාව ශක්තිමත් කිරීම සඳහා වූ මෙවලම් ලෙස අවදානම් සංචිත යෝජනා ක්‍රම හා ව්‍යසන බැඳුම්කර යොදා ගැනීම ජාතික හා කලාපීය වශයෙන් වඩ වඩා පොදුවේ සිදු වන්නක් බවට පත් වෙමින් ඇත.

රක්ෂණ වෙළඳ පොළවල් මෑතවින් ප්‍රාග්ධන සම්පාදිතව ඇති නමුත් අවදානම් මූල්‍යකරණය කරන ප්‍රාග්ධන වෙළඳ පොළවල් වෙත ප්‍රවේශ වීම සඳහා යන්ත්‍රණයන් සකසා ගෙන තිබෙන්නේ පහළ හා මැදි ආදායම්

**13 වන රූපය** තෝරා ගත් රටවල දී දේශීය ආණ්ඩු විසින් කෙරෙන ඒක පුද්ගල වියදම




ppp = puchasing power parity with data from 2010

*(මූලාශ්‍රය: UNISDR, 2013 Satterthwaite and Dodman දත්ත අනුව [23])*


රටවලින් සුළුතරයක් පමණකි. මේ වන විට ව්‍යසන රක්ෂණය වෙත ප්‍රවේශය තිබෙන්නේ එම රටවල කුටුම්බ හා ව්‍යාපාරවලින් සුළු ප්‍රමාණයකට පමණකි. දේශීය රක්ෂණ අංශවලට හැකියාවක් නොමැතිකම හෝ ප්‍රතිලාභ ලැබීමේ අවස්ථාව තිබෙන අය අතර ව්‍යසන රක්ෂණයේ පිරිවැයවල් හා ප්‍රතිලාභ පිළිබඳව තිබෙන්නේ සීමිත දැනුවත්කමක් වීම වැනි බාධක තිබෙන බව ද එමෙන් ම නිරවද්‍ය හා විශ්වසනීය අවදානම් මිනුම් නොමැති නිසා දුෂ්කරතාවන් තිබෙන බව ද රටවල් වාර්තා කරයි.

## නාගරීකරණය

### නාගරික වෙන්වෙන්ව සිදුවන සංවර්ධනය.

නාගරීකරණය ආර්ථික වර්ධනය පිළිබිඹු කරන බැවින් වේගවත් නාගරික සංවර්ධනය ම ද ආපදාවලට නිරාවරණය වූ ස්ථානවල අවදානම රාශිභූත වීමට දායක වේ. කෙසේ වුව ද පහළ හා මැදි ආදායම් රටවල් බොහොමයක දී නාගරික සංවර්ධනය ද නාගරික

**14 වන රූපය** තෝරා ගත් බ්‍රසීල නගර තුළ මඳ හා දළ බෑවුම් මත පිහිටි නොවිධිමත් කුටුම්බ




(මූලාශ්‍රය: *Alvalá et al.,* 2014 [25])

අවකාශය, යටිතල පහසුකම්, සේවාවන් හා ආරක්ෂාව සම්බන්ධ ඉහළින් ම අසමාන වූ ප්‍රවේශයකින් සමන්විත වේ.[24]

ප්‍රතිඵලය නම් සමාජීය වශයෙන් වෙන්වෙන්ව සිදුවන නාගරික සංවර්ධනය යි. එය විශාල හා තීව්‍ර යන දෙයාකාරයේ ම ආපදා අවදානම් සම්බන්ධයෙන් නව රටාවන් බිහි කරයි (14 රූපය). විශේෂයෙන් ම බොහෝ විට පහළ ආදායම් කුටුම්බවලට අඩු වටිනාකමකින් යුතු ඉඩම් සහිත, යටිතල පහසුකම් හා සමාජ රැකවරණය ඌන හෝ නොපවතින සහ පාරිසරික හායනය ඉහළ මට්ටමක තිබෙන ආපදාවලට නිරාවරණය වූ ප්‍රදේශවල වාසය කිරීමට බල කෙරේ.

හියෝගෝ ක්‍රියා රාමුව අවදානම් කෙරෙහි සංවේදී නාගරික සංවර්ධනයෙහි නිරත වීමට රටවලට විශාල ඉඩකඩක් සම්පාදනය කරයි. ඉහළ ආදායම් රටවල් හා මැදි ආදායම් රටවල සමහර විශාල නගර හියෝගෝ ක්‍රියා රාමුව අතරතුර දී මෙම ක්ෂේත්‍රයෙහි ලා කැපී පෙනෙන ප්‍රගතියක් අත් කර ගෙන ඇත. මෑත වසරවල දී අතිශයින් ම අපේක්ෂා සහගත සංවර්ධනයක් අත් කර ගත් රටවලින් සමහරක නගර ඒවායේ සැලසුම්කරණ හා කළමනාකරණ පාලනය යළි අත් කර ගැනීමට ද පළාත් පාලන ආයතන, කුටුම්බ හා ප්‍රජාවන් අතර නවීන හවුල්කාරිත්වයන් ඇති කිරීම හරහා එම නගරවල පාලනය ශක්තිමත් කිරීමට ද සමත් වී ඇත.

එහෙත් පහළ හා මැදි ආදායම් රටවලින් බොහොමයක් විශේෂයෙන් ම කුඩා නාගරික මධ්‍යස්ථානවල දී නිසි පරිදි හා අවදානම් කෙරෙහි සංවේදී ආකාරයෙන් නාගරික සංවර්ධනය සැලසුම් කිරීමට හා කළමනාකරණය කිරීමට අවශ්‍ය හැකියාවන් නොමැතිකමෙන් පෙළෙයි. මෙහි ප්‍රතිඵලයක් ලෙස නාගරික ආපදා අවදානම් ඒවා අවම කරනවාට වැඩි වේගයකින් වර්ධනය වී ඇත.

එළඹෙන දශකවල දී නාගරික සංවර්ධනයෙහි ලා දැවැන්ත ප්‍රාග්ධන ප්‍රමාණයක් ගලා යතැයි අපේක්ෂා කෙරේ. මේ දක්වා ගොඩ නගා තිබෙන්නේ 2030 වන විට නාගරීකරණය විය යුතු යැයි අපේක්ෂිත ප්‍රදේශවලින් සියයට 40කට ආසන්න ප්‍රමාණයක් පමණකි. 2000 සහ 2030 අතරතුර දී නාගරික ඉඩම් වැස්ම සම්බන්ධයෙන් අපේක්ෂිත ව්‍යාප්තිය පවතින්නේ සියයට 56 සහ 310 අතර පරාසයක ය.26 ආපදා අවදානම් අවම කිරීමේ අනාගතය මෙමම අනාගත නාගරික සංවර්ධනය අවදානම් කෙරෙහි සංවේදී වන බව සහතික කිරීම මත බෙහෙවින් රඳා පවතිනු ඇත.

## ස්වාභාවික සම්පත් පරිභෝජනය


අසීමිත ආර්ථික වර්ධනයක් ළඟා කර ගැනීමට උත්සාහ කිරීම බලශක්තිය, පිරිසිදු ජලය, වනාන්තර හා සාගර වාස භූමි, පිරිසිදු වාතය හා සරු පස ගෝලීය පරිමාණව වැඩි වැඩියෙන් හා තිරසර නොවන ආකාරයෙන් අධිපරිභෝජනය කිරීමට තුඩු දී ඇත. බලශක්තිය හා ස්වාභාවික ප්‍රාග්ධනය මෙලෙස අධිපරිභෝජනය කිරීම නිසා ඇති වන පාරිසරික පා සටහන් දැන් ග්‍රහලෝකයේ ජෛව ධාරිතාවෙන් සියයට 50ක් පමණ පසු කර යයි (15 රූපය).

ග්‍රහලෝකයේ කාබන් ඩයොක්සයිඩ් ($CO_2$) මුදා හැරීමේ සීමාව මිලියනයකට ඒකක (ppm) 350ක් වුවත්28 වර්තමානයේ පවතින මට්ටම් නොකඩවා ඉහළ යන අතර දැන් මිලියනයකට ඒකක (ppm) 400 දක්වා ළඟා වෙමින් පවතී. උෂ්ණත්වය, වර්ෂණය හා මුහුදු මට්ටම වැනි සාධකවල වෙනස් වීම් ඔස්සේ ගෝලීය දේශගුණික විපර්යාසය සමහර භූමි ප්‍රදේශවල දී හා අංශවල දී ආපදා මට්ටම් වෙනස් කරමින් ද ආපදා අවදානම් තීව්‍ර කරමින් ද සිටී.

අනෙක් අතට පාරිසරික අංශය ජාත්‍යන්තර හා කලාපීය ප්‍රතිපත්ති ශක්තිමත් කිරීම සඳහා සහ භාවිතය කෙරෙහි බලපෑමක් කිරීම සඳහා හියෝගෝ ක්‍රියා රාමුව යොදා ගැනීමට සමත් වී ඇත. මෙසේ ම දේශගුණික විපර්යාස අංශය ද වැදගත් අමතර දේශපාලනික හා ආර්ථික සහායක් හා වේගයක් ජනනය කර ඇත.

ආපදා අවදානම් අවම කිරීම දැන් හියෝගෝ ක්‍රියා රාමුවේ ආරම්භයේ දීට වඩා ජෛව විවිධත්වය, ජලය, තිරසරතාව, බලශක්තිය හා දේශගුණික විපර්යාසය සම්බන්ධ න්‍යාය පත්‍ර තුළට වඩා මැනවින් ඒකාබද්ධ කෙරේ. පාරිසරික බලපෑම් තක්සේරු ඇතුළු පාරිසරික කළමනාකරණය සම්බන්ධ ප්‍රවිෂ්ටයන් හා මෙවලම් ගණනාවක් දැන් ආපදා අවදානම පිළිබඳව පැහැදිලි ලෙස ම සැලකිලිමත් වන අතර දැන් සෑම මට්ටමක දී ම ආපදා අවදානම් කළමනාකරණය සම්බන්ධ පාරිසරික ප්‍රවිෂ්ටයන්හි වැඩි වැඩියෙන් ආයෝජනය කරනු ලැබේ.

**15 වන රූපය** ගෝලීය පාරිසරික පා සටහන් ජෛව ධාරිතාවෙන් සියයට 50ක් පමණ පසු කර යයි




(මූලාශ්‍රය: *Global Footprint Network* [27])

## ආපදා අවදානම් අවම කිරීමේ අනාගතය

හියෝගෝ ක්‍රියා රාමුව අතරතුර දී ආපදා අවදානම වේගයෙන් වැඩි වී තිබෙන බැවින් ආපදා අවදානම් අවම කිරීම ම ද වේගයෙන් පරිණාමය වෙමින් පවතී. නගර පාලනයන්, ව්‍යාපාර හා මූල්‍ය අංශය ඇතුළු නව පාර්ශ්වකරුවෝ වෙනස පෙරට ගෙන යමින් සිටිති. අවදානම් පාලනය, අවදානම් දැනුම, පිරිවැය-ප්‍රතිලාභ විශ්ලේෂණය හා වග වීම වැනි විවිධාකාර ක්ෂේත්‍රවල සිදු වන නවීකරණයන් නිසා පැරණි පිළිගැනීම් අභියෝගයට ලක් වන අතර නව අවස්ථා විවෘත වෙමින් පවතී.

2015 ගෝලීය තක්සේරු වාර්තාවෙන් පිරිනැමෙන්නේ ක්‍රියාව සඳහා *වැඩ සටහනක්* හෝ *රාමුවක්* නොව ආපදා අවදානම් අවම කිරීමේ අනාගතය පිළිබඳව දැන් සිදු වෙමින් පවත්නා නවීකරණයන් හඳුනා ගන්නා සාකච්ඡාවකි. වාර්තාවේ අභිමතාර්ථය වන්නේ ආපදා අවදානම් අවම කිරීමට, දේශගුණික විපර්යාසයට හා තිරසර සංවර්ධනයට අදාළව 2015 දී හා ඉන් ඔබ්බෙහි දී නව ජාත්‍යන්තර ගිවිසුම්වලින් මතු කෙරෙන අභියෝගයන්ට විසඳුම් සෙවීමට රටවල් පටන් ගන්නා විට තව දුරටත් කල්පනාන්විත වීම, විවාදයෙහි යෙදීම හා වැඩි දියුණු පරිචයන් සඳහා උනන්දු කිරීම යි.

## පාලනය ප්‍රතිසංස්කරණය කිරීම

ආපදාවලට සූදානම් වීම හා ප්‍රතිචාර දැක්වීම සඳහා අඛණ්ඩව කැප වී ගත් විශේෂඥ ආපදා කළමනාකරණ අංශයක් රටවල් නොකඩවා ඉල්ලා සිටිනු ඇත. අවදානම් අඛණ්ඩව වැඩි වන තාක් දුරට එවැනි අංශයක් උදෙසා කෙරෙන ඉල්ලීම් වැඩි වනු මිස අඩු නොවනු ඇත.

එහෙත් සංවර්ධනය කෙරෙහි බලපාන ආපදා හා දේශගුණික අවදානම් වෙත ඒ ඒ අංශවල හා භූමි ප්‍රදේශවල ශක්තිමත් කළ පාලන විධිවිධාන ඔස්සේ ප්‍රවිෂ්ට විය යුතු ය. මෙය නව ආයෝජනවල දී අවදානම් නිසි පරිදි කළමනාකරණය කෙරෙන බව ද පවත්නා ප්‍රාග්ධන තොගය තුළ අවදානම විද්‍යමාන වීම අවම කිරීම සඳහා අවදානම් කළමනාකරණය නිවැරදි කෙරෙන බව ද සෑම මට්ටමක දී ම ප්‍රකෘතිමත් වීමේ හැකියාව ශක්තිමත් කිරීම සඳහා පරිශ්‍රම දැරෙන බව

ද සහතික කිරීම පිණිස අපේක්ෂා සහගත අවදානම් කළමනාකරණ සංයෝගයක් ඉල්ලා සිටී.

## අවදානම් තොරතුරුවල සිට අවදානම් දැනුම දක්වා

අවදානම් මේ ආකාරයෙන් කළමනාකරණය කිරීමට නම් මීට වැඩි අවදානම් දැනුවත්කමක් හා දැනුමක් අවශ්‍ය වේ. හුදු අවදානම් තොරතුරු නිෂ්පාදනයේ සිට විවිධාකාර පරිහරණය කරන්නන්ට අවබෝධ කර ගත හැකි හා ක්‍රියාව සඳහා පදනම් කර ගත හැකි තොරතුරු හෙවත් අවදානම් *දැනුම* කරා අවධානය මාරු කර ගනිමින් සමාජීය අවදානම් තොරතුරු නිෂ්පාදනය ම ද පරිවර්තනයකට ලක් විය යුතු ය.

විශාල අවදානම කෙරෙහි වඩ වඩා සංවේදී වීම විශේෂයෙන් ම වැදගත් වේ. පුළුල්ව පැතිර පවතින හෙයින් මේ ස්වරූපයේ අවදානම් ඍජුව ම කුටුම්බයේ, ප්‍රජාවන්ගේ, කුඩා ව්‍යාපාරවල හා ප්‍රාදේශීය බලධාරි ආයතනවල එදිනෙදා සැලකිලිමත් වීම් සමග සම්බන්ධ ය. එමෙන් ම එය බොහෝ දුරට හැඩ ගැස්වෙන්නේ සමාජීයව, ආර්ථිකව හා පාරිසරිකව ගොදුරු වීමට ඇති ඉඩකඩ විසින් බැවින් අවදානම් කළමනාකරණ හා තිරසර සංවර්ධන පරිචයන් හරහා එය සාර්ථකව අවම කළ හැකි වේ.

## පිරිවැයවල් හා ප්‍රතිලාභ තක්සේරු කිරීම

සෑම මට්ටමක දී ම ආපදා අවදානම් කළමනාකරණයේ පිරිවැයවල් හා ප්‍රතිලාභ රාජ්‍ය හා පෞද්ගලික ආයෝජනය තුළ ද මූල්‍ය පද්ධතිය තුළ ද අවදානම් බෙදාහදා ගැනීමට හා සමාජ රැකවරණයට අදාළ යන්ත්‍රණයන්හි සැලැස්ම තුළ ද පූර්ණ ලෙස කේතගත කළ යුතු ය.

දරිද්‍රතාව හා අසමානතාව අවම කිරීමට, පාරිසරික තිරසරතාවට, ආර්ථික සංවර්ධනයට හා සමාජ ප්‍රගතියට අදාළව පහළට ගලා යන ප්‍රතිලාභ සහ මග හැරි පිරිවැයවල් ඇතුළු සෑම තීරණයක් තුළ ම ගැබ් වන සමබරතාවන් ඉස්මතු කර දැක්වීම සඳහා පිරිවැය-ප්‍රතිලාභ විශ්ලේෂණ පුළුල් කළ හැකි ය. අවදානම්වලට ගොදුරුව සිටින්නේ කවුරුන් ද, පිරිවැයවල් දරන්නේ කවුරුන් ද, ප්‍රතිලාභ නෙළා ගන්නේ කවුරුන් ද යන්න හඳුනා ගැනීම සඳහා උදව් වීමට ද ඒවාට හැකියාව ඇත. පිරිවැය-ප්‍රතිලාභ විශ්ලේෂණය සම්බන්ධ එවැනි පුළුල් ප්‍රවිෂ්ටයකට ආපදා අවදානම අවම කිරීමට අදාළ ආයෝජනවල ඇසට පෙනෙන බව හා ආකර්ෂණීයත්වය වැඩි කළ හැකි ය.

මූල්‍ය පද්ධති තුළ දී මෙම ප්‍රවිෂ්ටයට ආයෝජන තීරණ එම තීරණ නිසා ඇති වන ආපදා අවදානම් ප්‍රතිවිපාක සමග සමීපව සම්බන්ධ කරමින් වත්කම් හා ණය පරාස තුළ, බැරකම් හා ණය අනුපාතිකතා තුළ සහ ආර්ථික අනාවැකි තුළ නිසගයෙන් ගැබ් විය හැකි අවදානම් හඳුනා ගැනීම සඳහා උදව් විය හැකි ය. අවදානම් මූල්‍යකරණ හා සමාජ රැකවරණ පියවරයන් පහළ ආදායම් කුටුම්බ, සුළු ව්‍යාපාර හා පළාත් පාලන ආයතන දක්වා පුළුල් කිරීමට දිරි ගැන්වීම පිණිස තර්කනයක් සම්පාදනය කිරීමට ද ඊට හැකියාව ඇත.


## වග වීම ශක්තිමත් කිරීම

ආයෝජන තීරණ ගැනීමේ දී, මූල්‍ය අංශයේ දී හා අවදානම් බෙදාහදා ගැනීමේ යන්ත්‍රණයන්හි දී පූර්ණ ආපදා අවදානම් කළමනාකරණ පිරිවැයවල් හා ප්‍රතිලාභ සලකා බැලිය හැකි වන්නේ වගකිව යුත්තන් ඔවුන්ගේ තීරණවලට වග වන තත්ත්වයට පත් කළ හැකි වුව හොත් පමණකි. සමාජයන් ආපදා අවදානම්වලට හේතු හා ඒවායේ ප්‍රතිවිපාක යන දෙක ම කෙරෙහි වඩා සංවේදී තත්ත්වයට පත් වන්නේ නම් පසුව ඇති වන හානිවල හා බලපෑම්වල වගකීම සමාජීය කතිකාවට හා සාකච්ඡාවට ලක් කළ හැකි සමාජ ගැටලුවක් බවට පත් වනු ඇත. පැහැදිලිව වටහා ගත් ආපදා හානි හා බලපෑම් සම්බන්ධයෙන් පමණක් නො ව අනාගත අවදානම් ජනනය වීම හා රාශිභූත වීම සම්බන්ධයෙන් ද වග වීම වැඩි දියුණු වීමට මෙය හේතු විය හැකි ය.

සමාජීය ඉල්ලීම හා වග වීම එකිනෙකට සමීපව සම්බන්ධ ය. පහළ සිට ඉහළට ගමන් කරන ඉල්ලීමකින් තොර වන විට ආපදා අවදානම් කළමනාකරණය සඳහා සැපයෙන දේශපාලන සහායේ ඉහළ මට්ටම් පවා අවශ්‍ය ආකාරයේ වග වීමේ යන්ත්‍රණයන් නිර්මාණය කිරීමට අසමත් වනු ඇත.

එමෙන් ම රටවල්වල සිටින විවිධ බලධාරීන් ඉටු කරනු ඇත්තේ විවිධ කාර්ය භාරයන් ය. එකඟ වූ මිනුම් දඬු හා ඉලක්ක පදනම් කර ගෙන නිතිපතා කෙරෙන

**16 වන රූපය** ආපදා අවදානම් කළමනාකරණයේ අනාගතය




(මූලාශ්‍රය: UNISDR)

නිරීක්ෂණය හා වාර්තාකරණය මත වග වීම රඳා පවතී. විධායක අංශය සතුව පරමාර්ථ හා ඉලක්ක නියම කිරීමේ බලය තිබිය හැකි නමුත් රටවල් කිහිපයක් දැන් පාර්ලිමේන්තු කමිටු හා ජාතික පාලනය හෝ විගණන නිලධාරීන් විසින් අධීක්ෂණය කරනු ලැබීම වැනි යන්ත්‍රණයන් අත්හදා බලමින් සහ අනුකූලතාව සහතික කිරීමේ දී අධිකරණ අංශය ඉටු කරන කාර්ය භාරය ශක්තිමත් කරමින් සිටී.

වග වීම ශක්තිමත් කිරීමේ ක්‍රමයක් බවට පත් වීමට ස්වේච්ඡාමය ප්‍රමිතීන්ට ද විශාල හැකියාවක් ඇත. ව්‍යාපාරවලට, පළාත් පාලන ආයතනවලට හා ප්‍රජාවන්ට හුරු පුරුදු භාෂාවකින් හා ආකෘතියකින් සරල හා එකඟ වූ මිනුම් දඬු ඉදිරිපත් කරමින් දැනුවත්කම ඉහළ නැංවීම සඳහා සහ ආපදා කළමනාකරණයේ නියැලීම සඳහා උදව් කිරීමට ඒවාට හැකියාව ඇත.

## සංවර්ධනය තිරසර කිරීම

ආපදා අවදානම් අවම කිරීම මෙම නවීකරණයන් හා අනෙක් නවීකරණයන් මේ දක්වා ආපදා අවදානම් කළමනාකරණය කර ඇති ආකාරය අභියෝගයට ලක් කිරීමට පටන් ගන්නා බැවින් ඊට සැබෑ පරිවර්තනීය බලයක් බවට පත් විය හැකි ය.

දරිද්‍රතාව අවම කිරීම, සියල්ලන් සඳහා සෞඛ්‍යය හා අධ්‍යාපනය වැඩි දියුණු කිරීම, තිරසර හා සාධාරණ ආර්ථික වර්ධනයක් අත් කර ගැනීම සහ ග්‍රහලෝකයේ සෞඛ්‍යය ආරක්ෂා කිරීම දැන් රඳා පවතින්නේ ආණ්ඩු, සමාගම්, ආයෝජකයන්, සිවිල් සමාජ සංවිධාන, කුටුම්බ හා පුද්ගලයන් විසින් එදිනෙදා ගනු ලබන තීරණවල දී ආපදා අවදානම් කළමනාකරණය කිරීම මත ය. එම නිසා සංවර්ධනය තිරසර කිරීමට නම් ආපදා අවදානම් අවම කිරීම ශක්තිමත් කිරීම අත්‍යවශ්‍ය වේ.

# 2015 ගෝලීය තක්සේරු වාර්තාවේ නිපැයුම්

- සංක්ෂිප්ත ගෝලීය තක්සේරු වාර්තාව වාර්තාවේ ඇතුළත් ප්‍රධාන සාක්ෂි හා පණිවුඩ කෙටි, පහසුවෙන් කියවිය හැකි ආකෘතියකින් සාරාංශ කරයි.
- ප්‍රධාන වාර්තාව තුළ අන්තර්ගතයට අදාළව තව දුරටත් වැඩි දියුණු කරන ලද සම්බන්ධක අඩංගු වන අතර ඒවා ස්මාට් දුරකථන හා ටැබ්ලට් පරිගණක පරිහරණය කරන්නන් උදෙසා සක්‍රිය සිතියම්, වීඩියෝ, ඡායාරූප හා සිද්ධි අධ්‍යයන වෙත ප්‍රවේශය සපයයි.
- ටැබ්ලට් පරිගණක හා ස්මාට් දුරකථන පරිහරණය කරන්නන්ට Tangible Earth (GfT) මෘදුකාංග යෙදුම සඳහා සකස් කරන ලද ගෝලීය තක්සේරු වාර්තාව ද නොමිලේ ලබා ගත හැකි ය. GfT (හෙවත් “gift”) යනු පූර්ණ ලෙස අන්තර් ක්‍රියාකාරී, සියලු ගෝලීය තක්සේරු වාර්තාවල අඩංගු ආපදා සිදුවීම් ඇතුළු දශක ගණනාවක සක්‍රිය පෘථිවි විද්‍යාත්මක දත්ත කට්ටල සහිත ත්‍රිමාන ගෝලීය අතුරු මුහුණතකින් යුතු, තනිව ක්‍රියා කළ හැකි මෘදුකාංග යෙදුමකි. මෙම දත්ත කට්ටල අන්තර් ක්‍රියාකාරී අවදානම් සැලසුම්, සිතියම් හා ඡායාරූප මගින් උදාහරණ සහිතව පැහැදිලි කෙරෙන අතර (තථ්‍ය කාලය ද ඇතුළු) වේලාව, ස්ථානය, අවදානම් සාධකය, ආපදාව, ආපදා සිදුවීම හා තවත් දෑ අනුව ගවේෂණයට ලක් කළ හැකි ය.
- 2015 ගෝලීය තක්සේරු වාර්තාව පහත දැක්වෙන ස්වරූපවලින් වෙබ් සංස්කරණයක් ලෙස ද ලබා ගත හැකි ය:

අන්තර් ක්‍රියාකාරී ප්‍රධාන වාර්තාව - ඉංග්‍රීසි බසින්
ප්‍රධාන වාර්තාව (PDF) - අරාබි, චීන, ප්‍රංශ, රුසියානු හා ස්පාඤ්ඤ භාෂාවලින්
සංක්ෂිප්ත ගෝලීය තක්සේරු වාර්තාව - අරාබි, චීන, ප්‍රංශ, ජපාන, රුසියානු හා ස්පාඤ්ඤ භාෂාවලින්
උපග්‍රන්ථ
පසුබිම් ලියවිලි
හියෝගෝ ක්‍රියා රාමුව ක්‍රියාත්මක කිරීම පිළිබඳ ජාතික අන්තර්වාර ප්‍රගති වාර්තා
ආපදා හානි හා අවදානම් දත්ත පදනම් වෙත ප්‍රවේශය

2015 ගෝලීය තක්සේරු වාර්තාවේ සියලු නිපැයුම් වෙත පහත දැක්වෙන වෙබ් පිටුවෙන් ප්‍රවේශ විය හැකි ය:

**www.preventionweb.net/gar/**



UNISDR

The United Nations Office for Disaster Risk Reduction